කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

கொழும்புப பல்கலைக்கழகத்தின் கணணிக் கல்வி நிறுவனம்

**UNIVERSITY OF COLOMBO SCHOOL OF COMPUTING**




# 2014


වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

# Annual Report



# වාර්ෂික වාර්තාව
# 2014



කොළඹ විශ්වවිද්‍යාලයීය
පරිගණක
අධ්‍යයනායතනය

## කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

## අන්තර්ගතය


දැක්ම සහ මෙහෙවර ........................................ 01

අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය ........................................ 02

කාර්ය සාධනය (2012-2014) ........................................ 03
UCSC හි සමාලෝචනය ........................................ 05

පරිපාලනය ........................................ 08

අධ්‍යාපනය ........................................ 08
වැඩසටහන් සහ ශිෂ්‍යයන් ........................................ 08
උපාධි අපේක්ෂක අධ්‍යාපනය ........................................ 09
පශ්චාත් උපාධි අධ්‍යාපනය ........................................ 18
බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ........................................ 19
විදේශීය ශිෂ්‍යයන් ........................................ 22
ආරම්භ කළ නව පාඨමාලා ........................................ 23

පර්යේෂණ ........................................ 23
පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන ........................................ 23
සම්මේලන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු ........................................ 25
ලද සම්මාන ........................................ 26

අධ්‍යයන කාර්ය මණ්ඩලය ........................................ 26
අනධ්‍යයන-කාර්ය මණ්ඩලය: ස්ථිර (P) කොන්ත්‍රාත්තු/පැවරුම් (C/A) ........................................ 27

මූල්‍ය ........................................ 29
පුනරාවර්තන වියදම් ........................................ 29
ප්‍රාග්ධන වියදම් ........................................ 29
ව්‍යාපෘති (දේශීය/විදේශීය අරමුදල් සැපයූ) ........................................ 30
ව්‍යාපෘති වියදම් (දේශීය/විදේශීය අරමුදල් සැපයූ) ........................................ 32
මූල්‍ය ප්‍රගතිය (වියදම්) ........................................ 32
මූල්‍ය ප්‍රගතිය (උපයා ගත් ආදායම්) ........................................ 32
මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය ........................................ 33

2014 වර්ෂයේ යටිතල පහසුකම් ........................................ 33
මෙම වාර්තාව හා සම්බන්ධ වෙනත් විස්තර ........................................ 34

විගණනය කළ මූල්‍ය ප්‍රකාශය 2014 ........................................ 35
විගණකාධිපතිගේ වාර්තාව 2014 ........................................ 39
2014 විගණකාධිපතිගේ වාර්තාව කෙරෙහි UCSC හි අදහස් දැක්වීම ........................................ 47

# <u>කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය</u>

## වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2014 වර්ෂය

දැක්ම සහ මෙහෙවර

---

**දැක්ම**

*නව ඥානය නිර්මාණය කිරීම, විචාරාත්මක විමර්ශන සංස්කෘතියක් පෝෂණය කිරීම හා සේවා උද්‍යෝගයක් අභිවර්ධනය කිරීම සහ ජාතිය වෙනුවෙන් කැපවීම*

**මෙහෙවර**

*ජාතික සංවර්ධනයට දායකත්වය ලබාදෙන, නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක සහ ස්වෛරී චින්තනයක් සඳහා සහජ හැකියාවක් ඇති, උසස් සදාචාරාත්මක ප්‍රමිතින් හා සමාජීය වගකීමෙන් බැඳී, අග්‍රගණ්‍ය තාක්ෂණික නිපුණත්වයකින් හෙබි ජනතාවක් බිහිකිරීම*

**අරමුණු**

1. පරිගණක අධ්‍යාපනය ඉගැන්වීමේ සහ ඉගෙනුමේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම
2. පරිගණක අධ්‍යාපනය පිළිබඳ විෂයාන්තර පර්යේෂණවල සීමා පුළුල් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
3. ව්‍යවසායක නිපුණතා, නායකත්ව ගුණාංග ඇති, අවංක, සමාජයීය වශයෙන් වගකියන වෘත්තිකයින් බිහි කිරීම
4. ඵලදායී වැඩ සහ වෘත්තීය අභිවෘද්ධිය සඳහා හිතකර පරිසරයක් ඇති කර පවත්වා ගෙන යාම
5. ආයතනික ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම
6. තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT ) හරහා සමාජය සවිබල ගැන්වීම
7. රට දැනුමේ කේන්ද්‍රයක් බවට පත් කිරීම සඳහා කැපී පෙනෙන දායකත්ව ලබා දීම සහ අවශ්‍ය වෘත්තීය සේවා සැපයීම

## අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය

පරිගණක විද්‍යා උසස් අධ්‍යයන මධ්‍යස්ථානයක් ලෙස, මෙම ක්ෂේත්‍රයේ නවතම සංවර්ධන සමගින් IT කර්මාන්තයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි මට්ටමවල ශිෂ්‍යන් පුහුණු කිරීම සඳහා UCSC දිගටම කටයුතු කරගෙන යයි. සංශෝධිත විෂයමාලාව පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) හරහා පිරිනමන ලද උපාධි වැඩසටහන් හතරක් සඳහා අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් 757 දෙනෙක් බඳවා ගන්නා ලදී. පරිබාහිරව, විද්‍යා උපාධිධාරීන් 1,119 දෙනෙකු සඳහා අදාළ වූ විද්‍යාත්මක විෂය පථය තුළ IT භාවිතය පුහුණු කරන ලද අතර ශිෂ්‍යයන් 2,379 දෙනෙකුට බාහිර ශිෂ්‍යයන් ලෙස Bachelor of Information Technology (BIT) උපාධිය හැදෑරීමට අවස්ථාව සපයා දෙන ලදී. ශිෂ්‍යයන් 41 දෙනෙකු පර්යේෂණ උපාධි සඳහා බඳවා ගත් අතර ශිෂ්‍යයන් 370 දෙනෙකු විද්‍යාපති උපාධි සඳහා පුහුණුව ලැබීය. පසුගිය වර්ෂවල ලියාපදිංචි වූ අයගෙන් 440 දෙනෙකු උපාධි අපේක්ෂක මට්ටමේ සහ එක් ආචාර්ය උපාධිධාරියෙකු සහ දර්ශනපති උපාධිධාරීන් 6 දෙනෙකු ඇතුළුව 111 දෙනෙකු පශ්චාත් උපාධි මට්ටමේ උපාධි සම්පූර්ණ කරන ලදී.

පශ්චාත් උපාධි සහ BIT බාහිර උපාධිය UCSC හි ප්‍රධාන ආදායම් මාර්ග වන අතර ඒවා පිළිවෙළින් රුපියල් මිලියන 67කින් සහ 73කින් දායක විය. මිලියන 71ක් ගොඩනැගිලිවල ආයෝජනය කරන ලද අතර, මිලියන 37ක් උපකරණවල ආයෝජනය කරන ලදී. ඒවා සඳහා රජයේ ප්‍රදානය හුදෙක් මිලියන 15ක් විය. UCSC ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා කාර්ය මණ්ඩල සහභාගිත්වයට මිලියන 4.9කින්ද, කාර්ය මණ්ඩල රක්ෂණ වැඩසටහන සඳහා මිලියන 4.7කින්ද ශිෂ්‍ය ආපදා අරමුදලට මිලියන 2.9 කින්ද දායක විය.

වෙනත් පුහුණු කිරීමේ ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනීම පිණිස පර්යේෂණ හරහා නව දැනුම නිර්මාණය කිරීම කෙරෙහි UCSC වැඩි අවධානයක් යොදන ලදී. කාර්ය මණ්ඩලය විසින් සම්මන්ත්‍රණ සහ පර්යේෂණ පත්‍රිකා 67ක් ප්‍රකාශයට පත් කරන ලදී. තවද UCSC රාජ්‍ය අමාත්‍යාංශ සහ වෙනත් ආයතන වෙනුවෙන් උපදේශන ව්‍යාපෘති සිදු කිරීමද දිගටම කරගෙන යන ලදී. ශ්‍රී ලංකාවේ නැඟී එන තරුණ නායකයාට හිමි සම්මානය (Sri Lanka Emerging Young Leader Award), CIMA ගෝලීය ව්‍යාපාර අභියෝගය (CIMA Global Business Challenge) සහ කැපී පෙනෙන තරුණ තැනැත්තන් දහදෙනාගේ සම්මාන (Ten Outstanding Young Persons Award) යනාදිය ඇතුළු ප්‍රධාන සම්මාන 7ක් ජාතික හා ජාත්‍යන්තර උත්සවවල දී දිනා ගනිමින් කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් විසින් ජයග්‍රහණ අත් කර ගන්නා ලදී. පාසැල් දරුවන් ඉලක්ක කරගෙන ග්‍රාමීය ප්‍රදේශවලට ඔවුන්ගේ IT අත දීමේ වැඩසටහන්වල ශිෂ්‍යයන් දිගටම නියැලෙන අතරතුර, සමාජයට ඔවුන්ගේ දායකත්වය ලෙස කාර්ය මණ්ඩලය බොහෝ බාහිර කමිටු, මණ්ඩල සහ වෘත්තීය සංවිධාන සමඟ සම්බන්ධ වීම දිගටම කරගෙන යන ලදී.

නව මාර්ග හඳුනා ගැනීමට අපේ ක්‍රමෝපාය සැලසුම සමාලෝචනය කරන ලදී. 21වැනි සියවස සඳහා උසස් අධ්‍යාපනය (HETC) යන මුල් පිරීම හරහා බාහිර උපාධිය සහ පර්යේෂණ වාණිජකරණය සඳහා යෝජිත වැඩකටයුතු සාර්ථකව අඛණ්ඩව කර ගෙන යන ලදී. සියලු විශ්වවිද්‍යාලවලදී පවත්වන ලද ශිෂ්‍යයන්ගේ තොරතුරු තාක්ෂණ නිපුණතා පරීක්ෂණය, විශ්වවිද්‍යාලවලට තෝරා ගැනීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා වෙන් කිරීමේ පද්ධතිය වැනි HETC අරමුදල් සැපයූ වැඩසටහන් සහ වෙනත් අභියෝගාත්මක ව්‍යාපෘති බොහොමයකට UCSC විසින් අඛණ්ඩව අනුග්‍රහය දක්වන ලදී. එසේම UCSC කාර්ය මණ්ඩලය පර්යේෂණ ව්‍යාපෘති සඳහා NRC ප්‍රදාන සහ NSF ප්‍රදාන කිහිපයක් රැක ගැනීමෙහිලා සාර්ථක විය.

දිගු කාලයක් තිස්සේ අවශ්‍යව තිබූ UCSC හි භෞතික යටිතල පහසුකම් සංවර්ධන කටයුතු මෙම වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලද අතර සම්පූර්ණ කරන ලද ප්‍රදේශ කීපයක් උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් විසින් දැනටමත් භාවිතා කරනු ලැබේ. මෙය පසුගිය වර්ෂ පහ මුළුල්ලේ මුහුණ දුන් උග්‍ර ඉඩකඩ ගැටලුවලට අර්ධ වශයෙන් පිළිතුරු ලබා දෙනු ඇත. කෙසේ වුවද අනාගත ව්‍යාප්ත කිරීම් සඳහා පහසුකම් සැලසීම පිණිස සිදු කළ යුතු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයක් ද ඇත. ආචාර්ය උපාධිධාරීන් 20 දෙනෙකු සහිත රට තුළ අතිශයින් සුදුසුකම්ලත් පරිගණක කාර්ය මණ්ඩලය රඳවා ගැනීමට දිගටම කටයුතු කරගෙන යන අතරතුර එහි මානව සම්පත් හිඟයට අර්ධ වශයෙන් හෝ පිළිතුරු සැපයීමට

UCSC එහි අධ්‍යයන සංචිතය තවදුරටත් ශක්තිමත් කරන ලදී. උමියා විශ්වවිද්‍යාලය සමග ඇති කර ගත් විදේශ කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන ද අඛණ්ඩව කර ගෙන යන ලදී.

දැනට පවතින උපාධි වැඩසටහන් අන්තර්ජාතික ප්‍රමිතිවලට ගැළපෙන ලෙස විෂය මාලා සංවර්ධනය කිරීමේ වැඩකටයුතු අවසන් කිරීමත් සමඟ අපගේ උපාධිධාරීන්ගේ රැකියා නියුක්ත වීමේ හැකියාව ඉහළ ගිය අතර එය ඉංජිනේරු සහ වෛද්‍ය උපාධි මට්ටම් හා සමාන හෝ ඊට වඩා යහපත් මට්ටමක් අත් කර ගන්නා ලදී. උපාධි අපේක්ෂකයන් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයන් බඳවා ගැනීම මෙන්ම පර්යේෂණ ඇතුළුව උපාධිධාරීන් සහ පශ්චාත් උපාධිධාරීන් සංඛ්‍යාව ද ඉහළ යාමක් මෙම වසර තුළ දී නිරීක්ෂණය කරන ලදී. මෙම වසරේ දී ද අපේ උපාධි වැඩසටහන් සඳහා විදේශ ශිෂ්‍යයෙකු UCSC විසින් බඳවා ගන්නා ලදී.

## කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කාර්ය සාධනය (2012-2014)

| | | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| **අධ්‍යාපනය (ඇතුළත් කරගත්/උපාධිය ලත්)** | | | | |
| අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් | All | 738 | 769 | 757 |
| | In | - | 254 | 212 |
| | Out | 220 | 212 | 215 |
| විද්‍යා උපාධි අපේක්ෂකයන් | | 1267 | 1275 | 1119 |
| බාහිර ඩිප්ලෝමා | All | 4166 | 4175 | 4535 |
| | In | 2029 | 2034 | 2379 |
| | Out | 654 | 611 | 515 |
| බාහිර උසස් ඩිප්ලෝමා | All | 2390 | 2391 | 2583 |
| | In | 974 | 714 | 721 |
| | Out | 262 | 305 | 339 |
| බාහිර උපාධි | All | 1413 | 1416 | 1537 |
| | In | 476 | 312 | 347 |
| | Out | 172 | 194 | 225 |
| පශ්චාත් උපාධි | All | 523 | 303 | 370 |
| | In | 158 | 143 | 209 |
| | Out | 156 | 122 | 107 |
| ව්‍යාපෘති වැඩසටහන් | | 528 | 309 | 389 |
| **පර්යේෂණ** | | | | |
| පර්යේෂණ (දර්ශනපති/ආචාර්ය) | All | 41/01 | 39/07 | 41/09 |
| | In | 10 | 09 | 07/06 |
| | Out | 3 | 6 | 3/1 |
| පර්යේෂණ ව්‍යාපෘති | All | 05 | 05 | 10 |
| | New | 2 | 1 | 6 |
| ප්‍රකාශන | | 68 | 70 | 67 |

| | | | | |
|---|---|---|---|---|
| **උපදේශන ව්‍යාපෘති** | | | | |
| | දේශීය | 12 | 10 | |
| | විදේශීය | 01 | - | - |
| **සමාජ වගකීම යුතු භාවය පිළිබඳ වැඩසටහන්** | | 10 | 10 | 10 |

| | | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| **පාලනය** | | | | |
| ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු | 37 | 36 | 40 |
| | මහාචාර්යවරු | 02 | 02 | 03 |
| | ආචාර්ය | 19 | 20 | 20 |
| | විශාරද | 12 | 10 | 11 |
| ස්ථිර අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | | 04 | 04 | 04 |
| තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය (උපදේශකයන් සහ සහකාර කථිකාචාර්යවරුන්) | | 12 | 15 | 30 |
| ස්ථිර පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 34 | 40 | 40 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය (අනියම් සහ අභ්‍යාසලාභී ඇතුළුව) | | 67 | 49 | 42 |
| පර්යේෂණ/ව්‍යාපෘති කාර්ය මණ්ඩලය | | 10 | 11 | 27 |
| **මූල්‍ය** | | | | |
| වාර්ෂික පුනරාවර්තන වියදම (රුපියල් මිලියන) | | 111 | 133 | 161 |
| භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) (රුපියල් මිලියන)- සත්‍ය | | 92 | 90 | 94 |
| භාණ්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධන) (රුපියල් මිලියන)- සත්‍ය | | 19 | 26 | 15 |
| උපයන ලද අදායම | | 194 | 242 | 247 |
| ප්‍රථම උපාධි පාඨමාලාව සඳහා UCSC දායකත්වය (රුපියල් මිලියන) (උපයන ලද %) | | 31 (16%) | 88 (37%) | 185 (75%) |
| UCSC අයවැය (රුපියල් මිලියන) | | 246 | 363 | 577 |
| පර්යේෂණ/ව්‍යාපෘති ( රුපියල් මිලියන) | | 5.6 | 9.3 | 9.7 |
| සේවක පිරිවැය අනුපාතය (රුපියල් '000) වර්ෂයකට | | 670 | 774 | 795 |
| ශිෂ්‍ය පිරිවැය අනුපාතය (රුපියල් '000) – භාණ්ඩාගාර පුනරාවර්තන | | 151 | 152 | 190 |
| **යටිතල පහසුකම්** | | | | |
| පුස්තකාල පොත් | | 10,405 | 8,303 | 8,678 |
| පරිගණක : කාර්ය මණ්ඩලය | | 1:1 | | |
| පරිගණක : ශිෂ්‍යයන් (සාමාන්‍ය ශිෂ්‍යයන්)<br>(විශේෂ ශිෂ්‍යයන්) | | 1:4<br>1:1 | | |

| | | | |
|---|---|---|---|
| ඉඩ භාවිතය (සේවකයකු) (වර්ග මීටර්) | 9.42 | 10.42 | |
| ඉඩ භාවිතය (ශිෂ්‍යයකු) (වර්ග මීටර්) | 2.32 | 2.68 | |

## UCSC පිළිබඳ සමාලෝචනය

පරිගණක විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපනය සැපයීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස, අවසන් වරට 1995 අංක 1 දරන (සංශෝධිත) පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ(1) වගන්තිය යටතේ කළ නියමයක් මගින්, කොළඹ විශ්වවිද්‍යාලයේම ආයතන දෙකක් වන පරිගණක තාක්ෂණය පිළිබඳ විද්‍යායතනය (ICT) සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය (DCS) ඒකාබද්ධ කිරීමෙන් 2002 සැප්තැම්බර් 1 වන දින කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) පිහිටුවන ලදී. පනත ප්‍රකාරව එය උසස් අධ්‍යාපන ආයතනයකි. UCSC නියමාවලිය 2002 නොවැම්බර් 15 දින ගැසට් කරන ලද අතර (ගැසට් අංක. 1262/32) ඩිජිටල් වෝහාර තාක්ෂණික මධ්‍යස්ථානය ඇතුළු කිරීමට 2011 ජූලි 22 වන දින සංශෝධනය කරන ලදී (ගැසට් අංක. 1715/32).

## කෙටි ඉතිහාසය

කොළඹ විශ්වවිද්‍යාලයෙහි පරිගණක පිළිබඳ ඉගැන්වීම 1967 දී සංඛ්‍යාන ඒකකය ගණිත අධ්‍යයනාංශයේ වෙනම ඒකකයක් ලෙස පිහිටුවීම මගින් ප්‍රථම වරට ආරම්භ කරන ලදී. පසුව මහාචාර්ය වී.කේ. සමරනායකගේ මූලික මගපෙන්වීම මත, සංඛ්‍යාන ඒකකය සංඛ්‍යාන උපදේශනය සහ දත්ත සැකසුම් සේවා මධ්‍යස්ථානයක් ලෙස ඉහළ නංවන ලදී. මෙය බොහෝ අනාගත සංවර්ධනයන්ට මං සලසා තිබුණි. 1985 වන විට, මෙම මධ්‍යස්ථානය සංඛ්‍යානය සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය (DSCS) දක්වා වර්ධනය වී තිබුණි. මෙම අධ්‍යානාංශයේ ප්‍රධාන කාර්යය වූයේ සංඛ්‍යානය සහ පරිගණක විද්‍යාව පිළිබඳ විශේෂ උපාධි වැඩසටහන් පැවැත්වීමයි. ඇතුළත් කර ගැනීමේ ශිෂ්‍ය කණ්ඩායමකට හුදෙක් ශිෂ්‍යයන් 40 දෙනෙකු බිහි කරමින් DSCS පරිගණක විද්‍යා විශේෂීකරණ වැඩසටහන පිරිනැමූ අතර, එය පරිගණක විද්‍යා ක්ෂේත්‍රයෙහි (CS) වැඩිවන ඉල්ලුමට කිසිසේත් ප්‍රමාණවත් නොවීය.

1997 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ශිෂ්‍යයන් 50 ක කණ්ඩායමක් සෘජුවම පරිගණක විද්‍යා අධ්‍යයනය සඳහා බඳවා ගත් නමුත්, මේ වන විට, බොහෝ දෙනෙකු පරිගණක විද්‍යා ක්ෂේත්‍රයෙහි (CS) වැඩි වන ඉල්ලුමට සරිලන අයුරින් DSCS හි පරිගණක විද්‍යා උප අධ්‍යයනාංශය වෙනම අධ්‍යයනාංශයක් ලෙස පුළුල් කිරීමට අවශ්‍ය බව අවබෝධ කරගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2001 දී, DSCS නම් වශයෙන් පරිගණක විද්‍යා අධ්‍යයනාංශය සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය ලෙස අධ්‍යයනාංශ දෙකකට වෙන් කරන ලදී.

පරිගණක විද්‍යා අධ්‍යයනාංශය පීඨයක සීමාකාරී රාමුව තුළ ක්‍රියාත්මක වීමේ ස්වකීය සීමා හඳුනා ගත් අතර ඒ සමඟම එය අනාගත වර්ධන හැකියාව උකහා ගැනීම සඳහා ශක්තිමත් කර්මාන්ත සබඳතාවක් තිබීමේ වැදගත්කම අවබෝධ කර ගත්තේය. විශ්වවිද්‍යාලය විසින් කර්මාන්ත අභිමුඛ පරිගණක තාක්ෂණ ආයතනය (ICT) සහ න්‍යායිකව වඩාත් නැඹුරු වූ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යා අධ්‍යයනාංශය අතර උපායමාර්ගික ඒකාබද්ධ කිරීමක වැදගත්කම අවබෝධ කර ගන්නා ලදී. ICT හට කර්මාන්ත සමග ශක්තිමත් සබඳතාවක්ද ඒ සමගම විදේශීය ආධාර නියෝජිතායතන සමඟ උසස් ආයතනික පැතිකඩක්ද පැවතිණි. එසේම ICT ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA), ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (SIDA) සහ වෙනත් ආධාර ලබා දෙන්නන් කිහිප දෙනෙක් වෙතින් විශාල සම්පත් ප්‍රමාණයක් ලබා ගැනීම පහසු කරමින් ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම්වලදී වැඩි ස්වාධීපත්‍යයක් භුක්ති විඳින ලදී.

මෙම ඒකාබද්ධ කිරීම 2002 සැප්තැම්බර් 01 වන දින කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට (UCSC) උපත ලබා දුන්නේය. මහාචාර්ය. වී.කේ. සමරනායක ඔහුගේ චින්තනයෙන් UCSC හි අනුයාත ප්‍රයත්න කිහිපයකින් සාර්ථකත්වය අත්කර ගැනීමට මාර්ගය පාදා දුන් අතර, ඔහු UCSC හි ප්‍රථම අධ්‍යක්ෂ බවට පත් විය. මේ සියල්ල හරහා, UCSC හට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ICT පිළිබඳ විශිෂ්ටතම මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපනය වීමට හැකි විය.

විශ්වවිද්‍යාල පරිශ්‍රයේ සීමිත ඉඩකඩ හේතුවෙන් UCSC විසින් වර්තමානයේ පවතින බටහිර හා නැගෙනහිර ගොඩනැගිලි සංකීර්ණ පුළුල් කිරීම තුළින් අතිරේක බිම් හා පියැසි මුදුන් ඉඩක් ඉදි කරන ලදී. එමෙන්ම උතුරු හා දක්ෂිණ මහල් ඉදි කිරීම තුළින් ද UCSC සිය බිම් අවකාශය ව්‍යාප්ත කර ගන්නා ලදී. දැනට UCSC මහල් දෙකක පරිපාලන හා ආපනශාලා ගොඩනැගිල්ලක් ඉදි කර ඇති අතර බඳවා ගන්නා උපාධි අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව වැඩි කිරීමේ පරමාර්ථය ඇතිව ශ්‍රවණාගාරයක් සහ දේශන ශාලා ඉදි කිරීමේ කටයුතු සිදු කරමින් ඇත. මෙම මුල්පිරීම් තුළින් එක් ශිෂ්‍යයෙක්ට සිය අධ්‍යාපන කටයුතු කර ගෙන යාම සඳහා සැහෙන වර්ග මීටර 3.5ක ඉගෙනුම් වපසරියක් නිර්මාණය කිරීමට සමත් වී ඇති අතර ඉතා දීර්ඝ කාලයක පටන් එම තත්ත්වය වර්ග මීටර 2කට අඩු ප්‍රමාණයක් විය.

## UCSC හි සංවිධානය

අධ්‍යයනාංශ තුන සහ මධ්‍යස්ථාන හය ප්‍රවර්තන වර්ෂය සඳහා ද ඔවුන්ගේ ක්‍රියාකාරී වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම දිගටම කරගෙන යන ලදී.

## UCSC හි අධ්‍යයනාංශ

උපාධි අපේක්ෂක අධ්‍යයන වැඩසටහන සඳහා, රාජ්‍ය අරමුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා සෘජුවම UCSC වෙත ලැබේ. එමගින් ලැබෙන ප්‍රතිපාදන මුදල් වර්ෂය සඳහා සැලසුම්ගත ක්‍රියාකාරකම් කරගෙන යාමට ප්‍රමාණවත් නොවූ අතර එබැවින් ඇතැම් උපයා ගත් අදායම් උපාධි අපේක්ෂක අධ්‍යයන ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන ලදී. UCSC හි අධ්‍යයනාංශ තුනක් ඇති අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ විශේෂීකරණය සහ ඉගැන්වීමේ විශේෂඥතාවය පදනම් කොටගෙන මෙම අධ්‍යයනාංශ සඳහා වෙන් කර ඇත. පිළිවෙළින් උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි සහ බාහිර සහ ව්‍යාපෘති වැඩසටහන් ඒවායෙහිම ස්ව වැඩසටහන් පිරිනමනු නොලබන බැවින් ඒ පිළිබඳව බැලීමට අධ්‍යයනාංශ ප්‍රධානීන් තුන් දෙනෙකු පත් කරන ලදී. අධ්‍යයනාංශ තුන වන්නේ,

1. පරිගණකය සහ බුද්ධි තොරතුරු පද්ධති (CIS);
2. සන්නිවේදන සහ මාධ්‍ය තාක්ෂණවේද (CMT);
3. තොරතුරු පද්ධති ඉංජිනේරු විද්‍යාව (ISE).

## UCSC හි මධ්‍යස්ථාන

UCSC බොහෝ ද්විතීයික ක්‍රියාකාරකම් ද සිදු කරයි. මෙම ක්‍රියාකාරකම් වෙන් වූ මධ්‍යස්ථාන හයක් යටතේ සංවිධානය කෙරේ. එක් එක් මධ්‍යස්ථානය සඳහා මධ්‍යස්ථානයේ එදිනෙදා රාජකාරි කටයුතු කළමනාකරණය කරන සම්බන්ධීකාරකයකු සිටී. මධ්‍යස්ථාන හය පහත පරිදි ය:

1. උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය (ADMTC);
2. පරිගණක සේවා (CSC);
3. බාහිර උපාධි (EDC);
4. ඉලෙක්ට්‍රොනික් ඉගෙනුම (e LC);
5. වෘත්තීය සංවර්ධන (PDC);

6. ඩිජිටල් ව්‍යවහාර තාක්ෂණික (CDF).

## පරිපාලනය

මෙම වසර තුළ දී 2014-2018 වසර සඳහා වූ සංයුක්ත සැලැස්ම සකස් කරන ලදී. සැලසුම් කටයුතු අවසන් කර ගැනීම පිණිස කාර්ය මණ්ඩලය සමඟ සහ කළමණාකරණ මණ්ඩල විශේෂ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. අධ්‍යාපනය, පර්යේෂණය, උපදේශනය සහ සමාජ වගකීම ආදී වශයෙන් මුල් අවස්ථාවේ දී වර්ග කරන ලද ප්‍රධාන විෂයන්වල සිට UCSC ඉලක්ක හා පරමාර්ථ මත පදනම් වූ උපායමාර්ග සඳහා හඳුනා ගත් වැඩසටහන් දක්වා එහි ඉලක්කය වෙනස් විය.

### කළමනාකරණය

UCSC හි කළමනාකරණය අංශාධිපතිවරුන්ගේ සහ මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන්ගේ සහයෝගය ඇතිව UCSC හි නිලධාරීන් විසින් මෙහෙයවයි. UCSC හි සියලු ව්‍යවස්ථාපිත සහ තේරීම් කමිටුවල මූලසුන අධ්‍යක්ෂ විසින් හොබවයි.

### UCSC හි නිලධාරීන්

**අධ්‍යක්ෂ:** මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක; **නියෝජ්‍ය අධ්‍යක්ෂ:** මහාචාර්ය එන්.ඩී. කොඩිකාර (ඔක්. 01 දක්වා) සහ මහාචාර්ය කේ.පී. හේවාගමගේ (නොවැ. 01 සිට);

### UCSC හි අධ්‍යයනාංශ ප්‍රධානීන්

**CIS:** ජී.පී. සෙනෙවිරත්න (දෙසැ. 14 දක්වා) සහ ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරළ (දෙසැ. 15 සිට); **CMT:** ජී.කේ.ඒ. ඩයස්; **ISE:** මහාචාර්ය කේ.පී. හේවාගමගේ:

### UCSC හි මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරු

**ADMTC:** එස්.ටී. නන්දසාර; **CSC:** එල්.පී. ජයසිංහ; **EDC:** එස්.පී. ආරියරත්න (සැප්. 15දක්වා); **eLC:** ආචාර්ය ඩී.ඩී. කරුණාරත්න; **PDC:** ආචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක; **CDF:** කේ.එස්. ගුණතිලක.

#### *අධිකාරීන්*

විද්‍යායතනයේ අධිකාරීන් වන්නේ කළමනාකරණ මණ්ඩලය; ශාස්ත්‍රීය කමිටුව; අධ්‍යයන මණ්ඩල; අධ්‍යයන අධ්‍යයනාංශ සහ මධ්‍යස්ථාන.

#### කළමනාකරණ මණ්ඩලය

වර්ෂය තුළදී කළමනාකරණ මණ්ඩලයේ මාසික රැස්වීම් 12 ක් සහ විශේෂ රැස්වීම් 02 පවත්වන ලදී. කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත දක්වා ඇත.

අධ්‍යක්ෂ (සභාපති); නියෝජ්‍ය අධ්‍යක්ෂ; අධ්‍යයනාංශ ප්‍රධානී (CIS/CMT/ISE); **නම් කළ/ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය:** පියසේන රණේපුර; **නම් කළ/මුදල් අමාත්‍යාංශය:** ඩී.සී.ඒ. ගුණවර්ධන;**පීඨාධිපති, විද්‍යා පීඨය:** මහාචාර්ය ටී.ආර්. ආරියරත්න (ජන) සහ මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම (පෙබ සිට); **පාලක සභාව නම් කළ,:** සී. මාලියද්ද සහ එච්.එම්.එන්. වරකවුල්ල (ජූලි), ආර්.ජී. රුබසිංහ (අගෝ); **සනාතන සභාව නම් කළ, UOC:** මහාචාර්ය කේ.එච්. තෙන්නකෝන් සහ මහාචාර්ය. පී.එස්.එම්. ගුණරත්න; **විශ්වවිද්‍යාල**

**ප්‍රතිපාදන කොමිෂන් සභාව නම් කළ:** එස්. මුදලිගේ සහ දේශමාන්‍ය එම්.ඩී.ඩී. පීරිස්; **IT කර්මාන්තයේ නියෝජිතයන්:** මනෝ සේකරම් සහ ඩී.බී. සපරමාදු; **ශාස්ත්‍රීය කමිටුව නම් කළ,:** ආචාර්ය ඩී.එන්. රණසිංහ, ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න, ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරළ; හිටපු අධ්‍යක්ෂ (ආරාධනා කළ): ආචාර්ය ඒ.ආර්. වීරසිංහ.

කළමනාකරණ මණ්ඩලයට මූල්‍ය සහ කළමනාකරණ කමිටුව සහ විගණන කමිටුව යන උප කමිටු දෙක සහාය විය. වර්ෂය තුළ මෙකී කමිටු දෙක පිළිවෙලින් රැස්වීම් 04ක් සහ 04ක් පවත්වන ලදී. කමිටු දෙකේ සංයුතිය පහත දැක්වේ.

**මූල්‍ය සහ කළමනාකරණ කමිටුව**

අධ්‍යක්ෂ (සභාපති); නියෝජ්‍ය අධ්‍යක්ෂ; පියසේන රනේපුර; ඩී.සී.ඒ. ගුණවර්ධන; මහාචාර්ය. කේ.ආර්.ආර්. මහානාම; දේශමාන්‍ය එම්.ඩී.ඩී. පීරිස්.

**විගණන කමිටුව**

සුජීව මුදලිගේ (සභාපති මූල්‍ය විශේෂඥ); නියෝජ්‍ය අධ්‍යක්ෂ; සී. මාලියද්ද;පියසේන රනේපුර; ඩී.සී.ඒ. ගුණවර්ධන, එස්. සුනන්දා (විගණන අධිකාරී), අභ්‍යන්තර විගණකවරු (E&Y).

**ශාස්ත්‍රීය කමිටුව**

වර්ෂය තුළදී ශාස්ත්‍රීය කමිටුවේ රැස්වීම් 11ක් පවත්වන ලදී. ශාස්ත්‍රීය කමිටුවේ සංයුතිය පහත දැක් වේ.

අධ්‍යක්ෂ; නියෝජ්‍ය අධ්‍යක්ෂ; අධ්‍යයනාංශ ප්‍රධානීන් (CIS/ CMT/ISE); මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන් (ADMTC/CSC/ EDC/eLC/PDC); **නම් කළ (විද්‍යා පීඨය): මහාචාර්ය ආර්.ඩී. විජේසේකර;** නියෝජිතයන්/**IT කර්මාන්තය:** ආචාර්ය ආර්.ඒ.සී. රණසිංහ; ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන් (UCSC); **ඉගැන්වීම් කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකි:** එම්.පී.එම්.කේ. සිල්වා; ඩබ්.එම්.ආර්. වීරසූරිය; ආචාර්ය. ටී.එම්.එච්.ඒ. යූසුෆ්.

**අධ්‍යයන මණ්ඩල**

අධ්‍යයන මණ්ඩල තුනක් ඇත. නම් වශයෙන් IUD, RHD සහ EEP ය. ඔවුන් අභ්‍යන්තර උපාධි අපේක්ෂක උපාධි (IUD), පර්යේෂණ සහ උසස් උපාධි (RHD) සහ අභ්‍යන්තර සහ ව්‍යාපෘති වැඩසටහන් (EEP) වෙත යොමුවී ඇත. මණ්ඩල තුන වර්ෂය තුළ පිළිවෙළින් රැස්වීම් 10, 11 සහ 11 ක් පැවැත්විය.

**අධ්‍යාපනය**

**වැඩසටහන් සහ ශිෂ්‍යයන්**

UCSC විවිධ මට්ටම්වල පුළුල් පරාසයක වැඩසටහන් පිරිනමයි. 1 වන වගුව අදාළ ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සමගින් UCSC විසින් පවත්වන පාඨමාලා (වැඩසටහන්) හඳුන්වා දෙයි.

1 වන වගුව: පිරිනමන පාඨමාලා වර්ග

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි වැඩසටහන් | 1,125 | 64 | 62 |
| පර්යේෂණ සහ වෙනත් ව්‍යාපෘති | 49 | 19 | 25 |
| ව්‍යාප්ති පාඨමාලා | 389 | 33 | 25 |
| බාහිර උපාධි | 8,655 | 48 | 39 |
| මාර්ගගත | 16,278 | 4 | 9 |
| වෙනත් – විද්‍යා පීඨය | 1,119 | 21 | 2 |

**උපාධි අපේක්ෂක අධ්‍යාපනය**

උපාධි අපේක්ෂකයින් සඳහා පරිගණක අධ්‍යාපනය විද්‍යා පීඨයේ කොටසක් වශයෙන් 1967 දී මුලින්ම හඳුන්වා දෙන ලදී. UCSC විසින් මෙම අවස්ථාව විද්‍යා පීඨයේ සිසුන් 1,119කට ලබා දීම අඛණ්ඩව කරගෙන යන ලදී. පරිගණක විද්‍යාව උපාධියක් වශයෙන් ලබා දීම 1990 දී ආරම්භ කරන ලදී. සියල්ල එක්ව, උපාධි අපේක්ෂකයන් 1,876ක් UCSC හි පුහුණුව ලබමින් සිටී. දැනට UCSC විසින් සිසුන් 486කට පරිගණක විද්‍යා (CS) උපාධිය ද සිසුන් 271කට තොරතුරු පද්ධති (IS/ICT) උපාධියද පිරිනමයි.

**අභ්‍යන්තර උපාධි**

යෝජිත උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීම විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අතර 2012/2013 අධ්‍යයන වර්ෂයේ සිට එය ක්‍රියාත්මක වීම ආරම්භ විය.

පහත දැක්වෙන උපාධි පිරිනැමීම සඳහා පරිගණක විද්‍යා උපාධිය ප්‍රතිව්‍යුහගත කරන ලදී. අපේක්ෂිත උපාධිධාරී ගුණාංග අත්කර ගැනීම සඳහා සහ ලෝකය පුරා IT, IS සහ පරිගණක විද්‍යා වෘත්තිකයින්ගේ ඉහළ ඉල්ලුමට අමතරව IEEE/ACM විෂයමාලා නිර්දේශවලට අනුකූල වන පරිදි යෝජිත විෂයමාලාව සකස් කරන ලදී.

(i) පරිගණක විද්‍යාව පිළිබඳව, වසර තුනක විද්‍යාවේදී උපාධිය (පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී);
(ii) පරිගණක විද්‍යාව පිළිබඳව, වසර හතරක විද්‍යාවේදී ගෞරව උපාධිය (පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව)
(iii) මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳව, වසර හතරක විද්‍යාවේදී ගෞරව උපාධිය (පරිගණක මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව)

ව්‍යාපාර අවශ්‍යතා සහ තාක්ෂණික විසඳුම් අතර ඇති හිඩැස පුරවනු පිණිස නව ආකාරයක තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් බිහි කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධි වැඩසටහන (BICT) ප්‍රතිව්‍යුහගත කර ඇත. තොරතුරු පද්ධතිවේදී උපාධි වැඩසටහන මෙම නව ICT වෘත්තිකයන් බිහි කිරීමට නිර්මාණය කර ඇත. මෙම වැඩසටහනේ විෂය නිර්දේශය සන්නිවේදනය හා කණ්ඩායම් ක්‍රියා වැනි මෘදු කුසලතාවල ඇති වැදගත්කමද හුවා දක්වයි.

මෙම වැඩසටහන යටතේ පිරිනමන උපාධි පහත දැක්වෙන පරිදි වේ:-

(i) තොරතුරු පද්ධති පිළිබඳව වසර තුනක විද්‍යාවේදී උපාධිය (තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී)
(ii) තොරතුරු පද්ධති පිළිබඳව, වසර හතරක විද්‍යාවේදී ගෞරව උපාධිය (තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව).

උපාධි වැඩසටහන පවතින වසර තුනේ සහ 3+1 (වසර 4) උපාධි වෙනුවට 2+1 (වසර 3) සහ 2+2 (වසර 4) උපාධි පිරිනැමීමට ප්‍රතිනිර්මාණය කරන ලදී. නව CS විෂය ධාරා වැඩසටහනේ පවතින CS වසර 3 සහ 4 ට

අමතරව වසර 4 ක මෘදුකාංග ඉංජිනේරුකරණ (SE) විෂය ධාරාව දැන් අන්තර්ගතය. ඉහත වෙනස් කිරීම් හේතුවෙන් UCSC හට 2014 වසරේදී සාමාන්‍යයෙන් පවත්වන අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් හතර වෙනුවට හයක් පැවැත්වීමට සිදු විය.

2014 වසරේ පැවැත් වූ පරිගණක විද්‍යා විෂය ධාරාවේ උපාධි වැඩසටහන් යටතේ, 1වන සහ 2වන වසර සිසුන් සඳහා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියද (පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී) 3වන වසර සිසුන් සඳහා පරිගණක විද්‍යාවේදී (BCS) උපාධියද පවත්වන ලදී. 4වන වසර සිසුන් සඳහා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී) පවත්වන ලදී. CS උපාධිය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් සිසුන් තෝරා ගන්නා අතර ICT උපාධිය ඕනෑම විෂය ධාරාවකට විවෘතය.

තොරතුරු පද්ධති විෂය ධාරාව යටතේ, 1වන සහ 2වන වසර සිසුන් සඳහා තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධියද (තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී), 3වන වසර සිසුන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී (BICT) උපාධියද පවත්වන ලදී. 4වන වසර සිසුන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී) උපාධිය පවත්වන ලදී. මෙම වැඩසටහනේ විෂය නිර්දේශය සන්නිවේදනය හා කණ්ඩායම් ක්‍රියා වැනි මෘදු කුසලතාවල ඇති වැදගත්කමද හුවා දක්වයි. වැඩසටහන උ/පෙ ඕනෑම විෂය ධාරාවකට විවෘත අතර එබැවින් සිසුන් සුදුසුකම් ලැබීමට අභියෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ඉදිරි වසර සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීමේ අභියෝගතා පරීක්ෂණය ජූනි මස 22වැනි දින පවත්වන ලද අතර එම පරීක්ෂණය සඳහා ශිෂ්‍යයින් 1355 දෙනෙක් මුහුණ දුනි.

UCSC විසින් සිය උපාධි අපේක්ෂක වැඩසටහන ස්ථාවර කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂක පාඨමාලා සඳහා නව ඇතුළත් කර ගැනීමේ පොතක් පළ කර තිබිණි. ඔවුන් අපගේ ඇතුළත් කර ගැනීම, අපට දැනුම්දීමකින් තොරව 240 සිට 275 දක්වා වැඩි කර තිබිණි (පරිගණක විද්‍යාව 175; තොරතුරු පද්ධති 100).

**බඳවා ගැනීම**

2013/2014 බඳවා ගැනීම යටතේ, UCSC විසින් පරිගණක විද්‍යාව සඳහා ශිෂ්‍යයින් 143ක කණ්ඩායමක් බඳවා ගත් අතර තොරතුරු පද්ධති උපාධිය සඳහා ශිෂ්‍යයින් 69 දෙනෙක් බඳවා ගන්නා ලදී. 2014 වසරේ දී UCSC හි ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 757ක් විය. මෙම ශිෂ්‍යයින්ගේ විස්තරය 2වැනි වගුවේ දක්වා ඇත. බොහොමයක් ශිෂ්‍යයින් සිය 3වැනි වසරේ කාර්මික පත් කිරීම සම්පූර්ණ කිරීමට පෙර පවා තොරතුරු තාක්ෂණ අංශයේ කීර්තිමත් සමාගම් විසින් ආකර්ෂණීය කොන්ත්‍රාත්තු යටතේ බඳවා ගැනීම නිරීක්ෂණය කළ හැකි විය.

2 වගුව: අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන්

| පාඨමාලාව | ඇතුළත් කර ගැනීම 2013 | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | එකතුව | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය | 143 | 143 | 149 | - | - | 292 | - |
| පරිගණක විද්‍යාවේදී උපාධිය | - | - | - | 154 | - | 154 | 103 |
| පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය | 40 | - | - | - | 40 | 40 | 39 |
| තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධිය | 69 | 69 | 101 | - | - | 170 | - |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණවේදී | - | - | - | 78 | - | 78 | 53 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ | 23 | - | - | - | 23 | 23 | 20 |
| **UCSC හි උපාධි අපේක්ෂකයන්** | **275** | **212** | **250** | **232** | **63** | **757** | **215** |
| විද්‍යාවේදී විද්‍යා පීඨය | - | 474 | 349 | 262 | 34 | 1119 | - |
| **අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන්** | **275** | **686** | **599** | **494** | **97** | **1876** | **215** |

සියලු පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි

**බාහිර කාර්ය මණ්ඩලය**

අභ්‍යන්තර උපාධි අපේක්ෂක පාඨමාලා ප්‍රදානයේ දී මුළු අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය සහභාගී විය. ICT උපාධි පාඨමාලාවේ බාහිර සහාය අවශ්‍ය පාඨමාලා බොහොමයක් අඩංගුය. ICT/IS උපාධි වැඩසටහනේ පාඨමාලා 10ක් සහ CS උපාධි වැඩසටහනේ පාඨමාලා එකක් පැවැත්වීමට බාහිර කථිකාචාර්යවරුන් ලෙස පුද්ගලයින් 13 දෙනෙකුට ආරාධනා කරන ලදී.

**කාර්මික පත් කිරීම**

වෘත්තීය සංවර්ධන ආයතනය (PDC), තොරතුරු තාක්ෂණ කර්මාන්තය සමඟ සමීප සම්බන්ධතාව සහ උපාධි අපේක්ෂකයන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යයන වැඩසටහන්වල උන්නතිය කාර්මික සම්බන්ධය තුළින් අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. PDC, වර්ෂය තුළදී ඔවුන්ගේ මාස 6 පුහුණුව සඳහා උපාධි අපේක්ෂකයින් 230 දෙනෙකු UCSC ව්‍යාපෘති 9ක් ඇතුළුව සංවිධාන 70කට පත් කරන ලදී. මෙයට Linnaeus-Palme ශිෂ්‍ය හුවමාරු වැඩසටහන යටතේ උමියා විශ්වවිද්‍යාලයට පත් කළ UCSC සිසුන් දෙදෙනෙක් ඇතුළත් විය. උමියා විශ්වවිද්‍යාලයේ සිසුන් දෙදෙනෙක් ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයට පත් කරන ලදී. උපාධිධාරියෙක් වූ පසු ක්‍රියා කිරීමට සිදු වන වෘත්තීය භූමිකාව පිළිබඳ උපාධි අපේක්ෂකයින් දැනුවත් කිරීම සඳහා, ආරාධිත දේශන මාලාවක් PDC විසින් සමාගම්වලට ස්වේච්ඡාවෙන් සහභාගී වීම සඳහා සංවිධානය කරන ලදී. එම සිසුන් දෙදෙනාට ණය ප්‍රදානය කෙරිණි. මෙම දේශන හරහා, උපාධි අපේක්ෂකයින්ට මනා සමාරම්භක වැඩසටහනක් සහ ආධුනික පත්වීම සඳහා යාමට පෙර සූදානමක් සපයන ලදී. ආධුනික පත්වීමේ කාලය තුළ ලබා ගත යුතු අරමුණු හා කුසලතා පිළිබඳව ඔවුන්ට මනාව සන්නිවේදනය කරන ලදී.

කර්මාන්ත පුහුණුවට අමතරව PDC විසින් උපාධිය සම්පූර්ණ කරන ශිෂ්‍යයින් සඳහා රැකියා අවස්ථා ලබා දෙන අතරම ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහනක්, තාක්ෂණය පිළිබඳව සාකච්ඡා කිරීමේ සැසියක් සහ පුහුණු සම්මුඛ සාකච්ඡා අවස්ථාද සංවිධානය කරන ලදී.

ජූනි මස 16වැනි දින සිට 25වැනිදා දක්වා ප.ව. 4.30 සිට ප.ව. 7.30 දක්වා MIT Global Start up සැසිය UCSC හි දී පවත්වන ලදී. ඇ.එ.ජ. MIT ආයතනයේ පුහුණුකරුවන් 4දෙනෙක් විසින් පවත් වන ලද පුහුණු වැඩසටහන සඳහා UCSC හි කණ්ඩායම් දෙකක් සහභාගී විය.

**නේවාසිකාගාරය**

වසර තුළ දී, UCSC කොළඹ විශ්වවිද්‍යාලය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය අනුව යමින් නේවාසිකාගාර පහසුකම අත්‍යවශ්‍ය පළමු, තෙවැනි සහ හතරවන වසර උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් සඳහා නේවාසිකාගාර පහසුකම් සලසන ලදී. මෙම කාර්යය සඳහා පහත දැක්වෙන නේවාසිකාගාර කුලියට සහ බද්දට ගැනීම සිදු කරන ලදී. පසුකාලීනව බත්තරමුල්ලට ගෙන ගිය කිරුළපන පිහිටි පළමු වසර පිරිමි ශිෂ්‍යයින් සඳහා වූ නේවාසිකාගාරයේ සහ කොහුවල පිහිටි පළමු වසර කාන්තා ශිෂ්‍ය නේවාසිකාගාරයේ ශිෂ්‍යයින් 38දෙනෙක් සඳහා නේවාසික පහසුකම් ඇති අතර භාරකරුවෙක් සහ ශිෂ්‍ය නිවාස උප-පාලකයෙක් සිටී. නව නේවාසිකාගාරයක් ඉදි කිරීමේ කාර්යය සඳහා සුදුසු ඉඩමක් සෙවීමේ කටයුතු මෙම වසර තුළ දී සිදු කළ නමුත් ඉදිරිපත් කරන ලද බොහොමයක් මිල ගණන් අපගේ අයවැය ඉක්මවා ගිය බැවින් එම ව්‍යායාමය මෙතෙක් සාර්ථක කර ගැනීමට නොහැකි විය.

**ආපනශාලාව**

විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ආපන ශාලා කීපයක්ම පැවතිය ද සමාලෝචිත වසර තුළ දී UCSC විසින් එහි ශිෂ්‍යයින් සඳහාම වූ විශේෂ ආපන ශාලාවක් පවත්වා ගෙන යන ලදී. නව ආපන ශාලාවක් ඉදි කිරීම සඳහා පසුගිය වසරේ දී ආරම්භ කළ ඉදි කිරීම් කටයුතු මෙම වසර තුළ දී අවසන් කරන ලදී. මෙම නව ආපන ශාලාවට ශිෂ්‍යයින් 120 දෙනෙක් සඳහා පහසුකම් සැලසිය හැකි අතර ආහාර ගැනීමට, රූපවාහිනිය නැරඹීමට මෙන්ම අන්තර්ජාලයේ සැරිසැරීමට ද පහසුකම් ඇත.

### උපදේශනය

සියලු ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍ය උපදේශකයින් හතර දෙනෙකුගේ (කථිකාචාර්යවරයෙක් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු තිදෙනෙකුගේ) සේවය ලබා දෙන ලදී. තවද, උපදේශනය අවශ්‍ය වූ ශිෂ්‍යයන් සඳහා පහසුකම් සැලසීම පිණිස සතියකට පැය 3ක කාලපරිච්ඡේදයක් සඳහා වෘත්තීය උපදේශකයෙකුගේ සේවාව ද ලබා ගන්නා ලදී.

### උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා මූල්‍ය ආධාර

මහපොළ ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, කර්මාන්ත ශිෂ්‍යත්ව සහ පුද්ගලික ශිෂ්‍යත්ව යන ආකාරයෙන් ශිෂ්‍යයන් සඳහා මූල්‍ය ආධාර ලබා දෙන ලදී.

#### මහපොළ ශිෂ්‍යත්ව

වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයේ මහපොළ භාරකාර අරමුදලෙන් අනුග්‍රහය ලබන මහපොළ ශිෂ්‍යත්ව ශිෂ්‍යයන් 329ක් සඳහා පිරිනමන ලදී. කුසලතා සහ සාමාන්‍ය ශිෂ්‍යත්වවල වටිනාකම පිළිවෙලින් රු. 2,550/- ක් සහ රු. 2,500/-ක් විය.

#### ශිෂ්‍යාධාර

ශිෂ්‍යාධාර සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීම පාලනය කරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයට අනුව ශිෂ්‍යාධාර පිරිනමන ලදී. 2014වර්ෂය සඳහා ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍යයන්ගේ සංයුතිය පහත දැක්වෙන වගුවේ දැක්වේ. පූර්ණ ශිෂ්‍යාධාර සහ අර්ධ-ශිෂ්‍යාධාරවල වටිනාකම පිළිවෙළින් රු. 2,000/-ක් සහ රු. 1,900/-ක් විය.

#### නේවාසිකාගාර පහසුකම්

කාර්මික පත් කිරීම සඳහා 3වන වසර ශිෂ්‍යයන් අර්ධ වාර්ෂිකයක් ගත කරන බැවින් පළමු වසරේ ශිෂ්‍යයින් සඳහා පමණක් සාමාන්‍යයෙන් නේවාසිකාගාර පහසුකම් සලසනු ලැබේ. පුරප්පාඩු තිබූ බැවින් මෙම පහසුකම් තෙවැනි වසර ශිෂ්‍යයින් සඳහා ද විවෘත කරන ලදී.

මහපොළ, ශිෂ්‍යාධාර සහ නේවාසිකාගාර පහසුකම් ලබන ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

| ඇතුළත් කර ගැනීමේ වර්ෂය | අධ්‍යයන වර්ෂය | මහපොළ ශිෂ්‍යත්ව පිරිනැමීම | ශිෂ්‍යාධාර ලාභීන් | නේවාසිකාගාර පහසුකම් |
|---|---|---|---|---|
| 2013 | 1st year | 8 | 12 (06%) | 49 (23%) |
| 2012 | 2nd year | 1 | 39 (16%) | - |
| 2011 | 3rd year | 1 | 26 (11%) | 22 (09%) |
| 2010 | 4th year | 2 | 04 (06%) | - |

#### කර්මාන්ත ශිෂ්‍යත්ව

නම් වශයෙන් මිලේනියම් BSharp, අයිඑෆ්එස් ආර් ඇන්ඩ් ඩී සමාගම (IFS); සහ MIND යන බාහිර ආයතන තුනක් අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට අනුග්‍රාහකත්වය ලබා දුනි.

#### Shorea Robusta ශිෂ්‍යත්වය

කලින් පැවති පරිගණක විද්‍යා විශේෂ උපාධි වැඩසටහනේ උපාධිධාරී සංගමය විසින් 4වැනි වසරේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා වූ "Shorea Rubusta" ශිෂ්‍යත්වය නම් විශේෂ ශිෂ්‍යත්වයක් 2007 වසරේ දී හඳුන්වා දෙන ලදී. 2013 වසරේ දී මෙම යෝජනා ක්‍රමය යටතේ ශිෂ්‍යත්ව දෙකක් ප්‍රදානය කරන ලද අතර ශිෂ්‍යත්වයේ

වටිනාකම මාස 10ක අධ්‍යයන වර්ෂයක් සඳහා එක් මසකට රු. 2,500/-කි. මේ සඳහා තෝරා ගැනීම අධ්‍යයන කාර්ය සාධනය සහ ශිෂ්‍යයන්ගේ මූල්‍ය අවශ්‍යතා මත පදනම් වේ.

**UCSC ශිෂ්‍ය සංගමය**

2002 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතන නියමාවලිය 25 සහ 26 යන උප-පරිච්ඡේද අනුව 2012/13 වර්ෂය සඳහා ශිෂ්‍ය සංගම් නිලවරණය පවත්වන ලද අතර එහි නිලධාරීන් නිතරඟයෙන් පත් විය. සභාපති: බී.ඩී.එච්.කේ. ජයමාන්න; උප සභාපති: ඩී.වී.බී.සී. ජයසිංහ; උපසභාපති: එස්.එල්.ආර්. ද සිල්වා; ලේකම්: කේ.එම්.එස්.ඒ. කැල්ලෝරා; සංස්කාරක: ඩී.එම්.පී. දංගල්ල; කණිෂ්ඨ භාණ්ඩාගාරික: එම්.ජී.ඩී. මධුසංඛ; කමිටු සාමාජිකයන්: ජී.එන්. වනිගසිංහ; ටී. ජයනාත්; එම්.එෆ්. ජලීල්; ඩබ්.ඒ.එම්.එස්. වීරසූරිය; බී.එන්. දහනායක; ටී.එස්. සහනායක; සී.පී. රාජපක්ෂ; ඒ.ඒ.එම්. අෆ්සාර්; එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ලෙස දිගටම කටයුතු කළේය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම්**

ප්‍රධාන වශයෙන්ම සංස්කෘතික, චාරිත්‍රානුකූල සහ විනෝද ක්‍රීඩා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා වූ ශිෂ්‍ය ක්‍රියාකාරකම් ශිෂ්‍ය සංගමය හරහා සිදු කරන ලදී. ශිෂ්‍යයින් විසින් මාර්තු මාසයේ දී විදුනෙත දම් සිසිල වැඩසටහන; අප්‍රේල් මස 4වැනි දින පිරිත් උත්සවය; මැයි 2වැනි දින අවුරුදු උළෙල සංවිධානය කරන ලද අතර වෙසක් උත්සවය සැමරීම සඳහා මැයි මස 11වැනි දින පවත්වන ලද භක්ති ගී උත්සවය සඳහා ශිෂ්‍යයින් මෙන්ම කාර්ය මණ්ඩල සාමාජිකයින් ද සහභාගී විය. එමෙන්ම ශිෂ්‍යයින් විසින් UCSC ආපන ශාලාව ආසන්නයේ දී විශාල වෙසක් කූඩුවක් සාදන ලද අතර 300කට අධික කුඩා වෙසක් කූඩු සකස් කරමින් කොළඹ විශ්වවිද්‍යාලයේ සැරසිලි සඳහා දායක විය. මහාචාර්ය වී.කේ.සමරනායක මහතාගේ ගුණානුස්මරණය ඊර්රීර මස 3වැනි දින “ධර්ම දේශනාවක්”; ජූනි මාසයේ දී පොසොන් උත්සවයක් (ශාක්‍ය සිංහ ගුණ ගී දැහැන); පිළිකා රෝහලට ආධාර කිරීමේ වැඩසටහන; සංවිධානය කළ අතර ජූලි මාසයේ දී ක්‍රිකට් තරඟාවලිය; සැප්තැම්බර් 18වැනි දින ක්‍රීඩා දිනය; සැප්තැම්බර් 24වැනි දින පාරමිතා ලේ දන්දීමේ කඳවුර සංවිධානය කරන ලදී. මෙයට අමතරව, UCSC ශිෂ්‍යයින් විසින් නොවැම්බර් මස 8වැනි දින නවක ශිෂ්‍යයින් පිළිගැනීමේ උත්සවයක් සංවිධානය කළ අතර නොවැම්බර් මස 24 වැදි දින පැවති UoC වර්ණ රාත්‍රියේ දී UCSC ශිෂ්‍යයින් කීප දෙනෙක්ම ඇගයීමට හා පිළිගැනීමට ලක්වූහ. එමෙන්ම සමත් වූ ශිෂ්‍යයින් විසින් දෙසැම්බර් මස 4වැනි දින අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා රාත්‍රී භෝජනයක් පවත්වන ලද අතර සමුගැනීමේ සාදය; නත්තල් ගවමඩුව හා කැරොල්; නොවැම්බර් මස පැවති වානි වීලා උත්සවය පවත්වන ලදී. ශිෂ්‍ය කණ්ඩායම් චාරිකාව ද ඔවුන් සංවිධානය කළ ක්‍රියාකාරකම් අතර වේ. UCSC ශිෂ්‍යයින් විසින් අ.පො.ස (සා/පෙ) සහ අ.පො.ස. (උ/පෙ) විභාගවල තොරතුරු සන්නිවේදන තාක්ෂණය සඳහා උපකාර වනු පිණිස UCSC හි දී සහ පාසැල්වලදී වැඩමුළු කීපයක්ම සංවිධානය කරන ලදී. එමෙන්ම ශිෂ්‍යයින් විසින් අනුරාධපුරයේ දී දුෂ්කර ප්‍රදේශවල පාසැල් සඳහා පරිගණක වැඩමුළුවක් පවත්වන ලද අතර පරිගණකයක් පරිත්‍යාග කරන ලදී.

**ශිෂ්‍ය ජයග්‍රහණ**

UCSC හි හර්ෂ පෙරේරා විසින් ශ්‍රී ලංකාවේ නැගී එන තරුණ නායකයා සම්මානය **Sri Lanka Emerging Young Leader Award** (EYLA 2014) දිනා ගන්නා ලදී. අවසන් මහා තරඟය ජූනි 27 වන දින මහරගම, ජාතික තරුණ සේවා සභාවේදී පැවැත්විණි.

ජූනි 21 දින පැවති CIMA ගෝලීය ව්‍යාපාරික අභියෝගය 2014 (**CIMA Global Business Challenge 2014**) හි ශ්‍රී ලංකා ශූරයන් බවට කොළඹ විශ්වවිද්‍යාලය නියෝජනය කරන ආයතනික විශේෂඥ කණ්ඩායම පත් විය. තරඟයෙහි හොඳම කථිකයා බවටද පී. සමරකෝන් (UCSC) පත් වූ අතර, එස්. අබේසිරිගුණවර්ධන ( UCSC ), එස්. හේරත් (කළමනාකරණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය) සහ බී. අවන්ති (විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය) යන අය කණ්ඩායමේ සාමාජිකයන් විය. අගෝස්තු මස පළමු සතිය තුළ ඉන්දියාවේ මුම්බායිහි පැවති CIMA ගෝලීය ව්‍යාපාර අභියෝගය 2014 ගෝලීය අවසන් වටය (CIMA Global Business Challenge 2014 Global Finale) සඳහා කණ්ඩායම ශ්‍රී ලංකාව නියෝජනය කළ අතර ජයග්‍රාහකයන් බවට පත් විය.

නොවැම්බර් 12 වන දින පැවති CIMA ආයතනයේ ව්‍යාපාර සම්මාන රාත්‍රියේදී ගෝලීය CIMA ජයග්‍රාහකයන් ඇගයීමට ලක් වූ අතර ඔවුන් අතරින් දෙදෙනෙකු UCSC වෙතින් විය.

ශිෂ්‍යයන් විසින් තෘතීයික (ව්‍යාපාර) සඳහා **National Best Quality ICT Awards** (NBQSA) **රන් සම්මානය** දිනා ගන්නා ලදී: පී.එන්. පීරිස්; එම්.එච්. පෙරේරා; එම්.එස්. කුමාරගේ; ඩී චන්ද්‍රන, "ta.lk – මහජන පැමිණිලි පද්ධතිය"; තෘතීයික (ව්‍යාපාර) සඳහා NBQSA **ලෝකඩ සම්මානය**: ජී.කේ. වාකිෂ්ට; එස්.ජේ. අබයරත්න; ජී.ටී. මෙන්ඩිස්, "Alco tracker: අධිබණ්ඩමය ප්‍රයෝගවල සහ ප්‍රතිචාර දැක්වීමේ කාලයෙහි වෙනස් වීම් හරහා ශ්‍රී ලාංකිකයන් තුළ මද්‍යසාර ආධූලන මට්ටම හඳුනා ගැනීම"; තෘතීය (තාක්ෂණය) සඳහා NBQSA **කුසලතා සම්මාන දෙකකි**: වයි. යහම්පත්, "ධ්වනි අනුනාද ස්ථානය ඔස්සේ බාධක වර්ගීකරණය" සහ ටී.එස්.ආර්. පීරිස්; ආර්.ඒ. අමරසිංහ; එල්.කේ. සිවගනේෂන්; ටී.එල්. සෙනෙවිරත්න; ජී.එම්. ප්‍රියංකර, "Sens" සහ NBQSA තෘතීයික (ව්‍යාපාර) සඳහා **කුසලතා** සම්මානය: "Sasthara" සඳහාය.

**Imagine Cup** යනු විවිධ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රවර්ග යටතේ පවත්වන වාර්ෂික තරඟයකි. ශිෂ්‍යයන් ක්‍රීඩා ප්‍රවර්ගය **දිනා ගන්නා ලදී**. බී. සේනාරත්න, එම්. විජේවික්‍රම, පී. සමරකෝන් සහ එස්. ගුණසිංහ, හැට් ඇන්ඩ් තින් ස්ටුඩියෝස් 'බර්ඩ් ඇකඩමි' ලෝක පුරවැසි ප්‍රවර්ගයේ **දෙවන ස්ථානය** දිනාගත්තේය: වයි. කේ. ලොකුගේ (කණ්ඩායම් නායක), පී. මදුමල්, ටී. කුමාර, ඩී. රණසිංහ: ටෙක්සර්ජ් " Navisys " සහ නවෝත්පාදන ප්‍රවර්ගයේ **තෙවන ස්ථානය**: " We-cobraz "V-Detector".

**IEEE Extreme** 8.0 ගෝලීය ක්‍රමලේඛ තරගය ශිෂ්‍යයන් 280ක (කණ්ඩායම් 86ක) සහභාගිත්වයෙන් ඔක්තෝබර් 18 වන දින පැය 24 සිට, UCSC හිදී පැවැත්විණි. UCSC හි ඉහළම කණ්ඩායම්වලට මෙතෙක් Extreme ඉතිහාසයේ ලබාගත හැකි වූ ඉහළම ශ්‍රේණිගත කිරීම් ලබා ගැනීමට හැකි විය. අපේ ඉහළම කණ්ඩායම "Freakz " ශ්‍රී ලංකාවේ 7 වන ස්ථානය සහ ලෝකයේ 109 වන ස්ථානය ලබා ගත්තේය. අපගේ කණ්ඩායම් 4කට ලොව පළමු 200 දෙනා අතරට පැමිණීමට හැකි විය.

2014 වසරේ දී මාලබේ SLIIT ආයතනයේ පැවති **Code Fest තරඟාවලියේ** දී UCSC ශිෂ්‍යයන් විසින් පළමු ස්ථානය සඳහා රු. 70,000ක මුදල් ත්‍යාගයක් සමඟ **රන් සම්මානය** දිනා ගන්නා ලදී. රන් සම්මානය දිනා ගන්නා ලද්දේ පී.එන්. පීරිස්, එම්.ඒ. ෂෙල්ටන්, එච් පෙරේරා සහ ෆෝල්කන් සඳහා එස් උදේශිනී විසිනි.

2014 නොවැම්බර් 5 වන දින පැවති ඊ-ස්වාභිමානි 2014 සම්මාන ප්‍රදානයේදී UCSC **සම්මාන 4 ක්** (ජයග්‍රාහකයන් 3 දෙනෙක් සහ විශේෂ කුසලතා 1 ක්) දිනා ගන්නා ලදී. ඊ-විද්‍යාව සහ තාක්ෂණය ප්‍රවර්ගය: කාර්ය මණ්ඩලය විසින් නිපදවන ලද වරාය යාත්‍රා මාර්ග තදබදය කළමනාකරණ පද්ධතිය 'සියරා': ශ්‍රී ලංකාවේ අපරාධ වාර්තා කොට්ඨාශය සමග එක්ව තීක්ෂණ විසින් නිපදවන ලද ස්වයංක්‍රීය ඇඟිලි සලකුණු හඳුනා ගැනීමේ පද්ධතිය ( AFIS) සඳහා ඊ රාජ්‍ය සහ ආයතන ප්‍රවර්ගය සහ UCSC හි 4 වන වසර ICT සිසුන් විසින් නිපදවන ලද ස්වරාලෝක සඳහා ඊ අන්තර්ගතය සහ සහභාගිත්වය ප්‍රවර්ගය: ශිෂ්‍යයන් ආචාර්ය කේ. එල්. ජයරත්නගේ අධීක්ෂණය යටතේ එස්. සී. කුමාරි, ඩී. බී. කිරිඇල්ල, කේ. සී. රණසිංහ යන ජයග්‍රාහකයන් විය. UCSC හි මෘදුකාංග සංවර්ධන ඒකකය විසින් නිපදවන ලද හිමිකම් ලියාපදිංචි කිරීමේ පද්ධතිය සඳහා ඊ-රාජ්‍ය සහ ආයතන ප්‍රවර්ගය වෙනුවෙන් විශේෂ කුසලතා සම්මානය හිමි විය.

යසිත් ලොකුගේ, ප්‍රශාන් මදුමාල්, තරිඳු කුමාර හා එන් රණසිංහ විසින් නිපද වූ ස්වයංක්‍රීය මඟ පෙන්වීමේ රෝද පුටුව සඳහා 2014 පෙබරවාරි 21 වන දින UCSC හි පැවති **2013 අන්තර් විශ්වවිද්‍යාල නවෝත්පාදන ශූරතාවලියේ දී දෙවැනි ස්ථානය** හිමි විය. m-අධ්‍යාපනය සහ ඉගෙනුම් ප්‍රවර්ගය: වයි. කේ. ලොකුගේ ශිෂ්‍යයාගේ සිප්සල ශිෂ්‍ය ව්‍යාපෘතියට ඉන්දියාවේ පැවති MBillionth සම්මානය හිමි විය.

3වන වසර ශිෂ්‍යයෙකු වූ මනිෂා විජේසේකරගේ ව්‍යාපෘතිය නොවැම්බර් 20 වන දින නවදිල්ලියේ පැවති අංකිත සවිබලගැන්වීම සඳහා සමාජ මාධ්‍ය සම්මාන 2014 අවසන් මහා තරඟයේදී මයි ක්‍රවුඩ් ෆන්ඩින්ග් ප්‍රවර්ගයේ දෙවන ස්ථානයට පත් විය.

hSenid Mobile විසින් සංවිධානය කරන ලද ටෙලිකොම් යෙදුම් සංවර්ධන තරඟයක් වූ **TAD Hackathon** ජූනි 6-7 දිනවල පැවැත්විණි. UCSC වෙතින් වූ කණ්ඩායමක් 7 වන දින ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නුවර පැවති

තරඟයට සහභාගී වීමට සුදුසුකම් ලැබීය.

2 වන වසර ශිෂ්‍යයන් දෙදෙනෙක්: එම්. එස්. කුමාරගේ සහ පී.ඒ.ඒ. රන්දිකා විසින් **Google Summer of Code** 2014 සාර්ථකව නිම කරන ලදී.

එච්. එච්. ඒ. ටී. අසන්ති (2010/ ICT /099) සහ එම්.එස්. යටිගල (2010/ ICT/05) දෙසැම්බර් 16-17 දක්වා තායිලන්තයේ පතායා නුවර පැවති සම්මන්ත්‍රණයකට සහභාගී විය.

**ක්‍රීඩා**

ඩබ්.ඒ.ආර්.ආර් සෝමවීර (2013/IS/055) සහ කේ.ජේ.එම්.සී තරංග (2013/CS/128) නොවැම්බර් 16-18 මැලේසියාවේ පැවති ජාත්‍යන්තර අන්තර් විශ්වවිද්‍යාලයීය ආරාධිත ක්‍රිකට් තරඟාවලියට සහභාගී විය.

පහත UCSC ශිෂ්‍යයන් කොළඹ විශ්වවිද්‍යාලයේ ඒ ඒ ක්‍රීඩාව සඳහා නායක හෝ උපනායක ලෙස පත් කරන ලදී. නැතහොත් UCSC කණ්ඩායම පහත සඳහන් කුසලාන 2013 වර්ණ රාත්‍රියේදී දිනා ගෙන ඇත.

**මලල ක්‍රීඩා/ ජවන හා පිටිය:**
**වර්ණ ලැයිස්තුව (කාන්තා)** - එස්.එන්.එන්. හෙට්ටිආරච්චි.

**බැඩ්මින්ටන්:**
**වර්ණ ලැයිස්තුව (පිරිමි)** - ජී.කේ.ආර්.බී ගජනායක, පී.එම්. රණතුංග

**වර්ණ ලැයිස්තුව (කාන්තා)** -
*ඩී.ජී.යූ. අමරසිංහ, *ටී.ඩී.පී. පීරිස්.

**බේස්බෝල්:**
**වර්ණ ලැයිස්තුව (පිරිමි)** - ටී.එස්. දහනායක, *අයි.ඒ. විජේසිංහ.

**කැරම්;**
**වර්ණ ලැයිස්තුව (පිරිමි)** - එච්.එම්.ඒ.යූ. බණ්ඩාර, *ඊ.ඩී.එස්.සී. කරුණාපාල;

**වර්ණ ලැයිස්තුව (කාන්තා)** - බී.එස්. විජේරත්න, ටී.ඒ.කේ. ලෝචන, *පී.එම්. කේ.ඒ. මාදුගොඩ, *එච්.එච්.අයි.ඩී. ෆ්ලොරන්ස්.

**චෙස්:**
**වර්ණ ලැයිස්තුව (පිරිමි)** ඩබ්.ඒ.ආර්.එම්. විජේසූරිය, එම්.ඩී.වයි. පෙරේරා, *ඩී.සී. මාලිමගේ;

**වර්ණ ලැයිස්තුව (කාන්තා)** - සී.ඕ.බී. වීරතුංග.

**එල්ලේ:**
**වර්ණ ලැයිස්තුව (පිරිමි)** - ජී.ඒ. මධුශංක

**පාපන්දු:**
**වර්ණ ලැයිස්තුව** - ඩබ්.ඒ.එම්.ආර්.සී. අභයරත්න, ජී.ඩබ්. එස්.සී. ගිංතොට.

**හොකී:**
**වර්ණ ලැයිස්තුව (පිරිමි)** - කේ.කේ.ටී.පී. රණතුංග, *ඒ.ඒ.ජේ. භාගිත; **(තාක්ෂණ)** ඩබ්.සී.ඊ. වික්‍රමසිංහ, *කේ.ජී. එච්.යූ. දේශප්‍රිය.

**කරාටේ:**

**වර්ණ ලැයිස්තුව (පිරිමි)** - *අයි.ඒ.ඩී.කේ.සී.ඩබ්. ගුණරත්න; **(W)** - *එල්.ජී.ඒ. තිලංකා මෙය; **නායක (පිරිමි)** අයි.ඒ.ඩී.කේ.සී.ඩබ්. ගුණරත්න;

**(කාන්තා)** - එල්.ජී.ඒ. තිලංකා මෙය.

**මග හරහා දිවීම:** මග හරහා දිවීම සඳහා UCSC **අභියෝගතා කුසලානය, පීය කුසලානය.**

**ඔරු පැදීම:**

**වර්ණ ලැයිස්තුව (පිරිමි) එන්.ඒ.එන්.එස්.එස්. මිහිඳුකුලසූරිය** (2010/ICT/001)

**රග්බි:**

**වර්ණ ලැයිස්තුව** - එච්.පී.අයි.වී. පතිරණ, අයි.එම්.එස්.එම හේරත්.

**පිහිනුම්:**

**වර්ණ ලැයිස්තුව (පිරිමි)** - *ජී.බී.එස්. දසිල්වා.

**ටයිකොන්ඩෝ:**

**වර්ණ ලැයිස්තුව (පිරිමි)** - ඩබ්.ඒ.හම්.එස්. වීරසූරිය, *ඒ.පී.ටී. විශ්වකුල; **නායක (පිරිමි)** - ඒ.පී.ටී. විශ්වකුල

**ටෙනිස්:**

**වර්ණ ලැයිස්තුව (කාන්තා)** - *ජී.ඒ.ඩී.එම ගනේපොළ මෙය, *බී.එල්.ඩබ්. විතාරණ මෙය.

**වොලිබෝල්:**

2013 - **වර්ණ ලැයිස්තුව (පිරිමි)** - වයි.එම්.කේ.කේ. යාපාරත්න, *ආර්.එම්.කේ.එච්. රණසිංහ; **නායක (පිරිමි)** - ආර්.එම්.කේ.එච්. රණසිංහ.

**උපාධි ප්‍රදානය**

උපාධි වැඩසටහන් 4ක ශිෂ්‍යයන් 215ක් සඳහා උපාධි ප්‍රදානෝත්සවය 2014 ජූනි 10 වන දින පවත්වන ලදී. ICT උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ඕනෑම උ/පෙ විෂය ධාරාවක් යටතේ තෝරා ගන්නා ලදී. මෙම සිසුන් සඳහා විෂය ධාරාවට අදාළව කාර්ය සාධනය 3 වන වගුවෙන් පෙන්වයි.


4වන සහ 3වන වසර සඳහා උපාධිය සම්පූර්ණ කිරීමෙන් පිළිවෙළින් මාස හතකට සහ දහයකට පසුව පැවැත්වූ උපාධි ප්‍රදානෝත්සවය අතරතුර අමාත්‍යාංශය විසින් සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම වාර්තාවෙහි ඇතුළත් කිරීමට තවම සමීක්ෂණයේ විස්තර ලබා ගත නොහැකිය.

3 වගුව: UCSC උපාධිධාරීන්ගේ කාර්ය සාධනය

| ඇතුළත් කර ගැනීම | පළමු | ඉහළ | පහළ | සමත් | එකතුව |
|---|---|---|---|---|---|
| BCSc | 2 | 1 | 17 | 83 | **103** |
| BICT | 0 | 0 | 15 | 38 | **53** |
| ගණිතය | 0 | 0 | 8 | 16 | **24** |
| ජීව විද්‍යාව | 0 | 0 | 3 | 3 | **06** |
| වාණිජ්‍යය | 0 | 0 | 4 | 14 | **18** |
| කලා | 0 | 0 | 0 | 5 | **05** |
| BSc CS | 1 | 14 | 10 | 5 | **39** |

| | | | | | |
|---|---|---|---|---|---|
| BSc ICT | 4 | 12 | 3 | 1 | 20 |
| ගණිතය | 2 | 10 | 2 | 0 | 14 |
| ජීව විද්‍යාව | 2 | 2 | 1 | 1 | 06 |
| වාණිජ්‍යය | 0 | 0 | 0 | 0 | 00 |
| කලා | 0 | 0 | 0 | 0 | 00 |
| **එකතුව** | **1** | **27** | **45** | **127** | **215** |

2013 රැස් කළ අමාත්‍යාංශ දත්ත මත පදනම්ව UCSC උපාධිධාරීන්ගේ සේවා නියුක්තික හැකියාව වෛද්‍ය උපාධිධාරීන් හා සමාන බවත් ඉංජිනේරු උපාධිධාරීන්ට වඩා යහපත් බවත්, රූප සටහන 1 පෙන්වයි. ඒ හා සමාන සමීක්ෂණයක් බාහිර උපාධිධාරීන් සඳහා උපාධි ලැබීමෙන් මාස දෙකකට පසුව (අභ්‍යන්තර කාල සීමාවට වඩා බෙහෙවින් කෙටි කාල සීමාවක්) සිදු කරන ලද අතර එම උපාධිධාරීන් 77% ක් රැකියාවල නියුක්ත වූ අතර 13% ක් පමණක් රැකියා සොයමින් සිටි බව දැක්වේ.




රූප සටහන 1: විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ රැකියා නියුක්තික හැකියාව

**සම්මාන**

UCSCහි විශිෂ්ටතම උපාධිධාරියා සඳහා වූ මහාචාර්ය වී.කේ. සමරනායක පදක්කම එම්.ජී.ඩී.කේ. ප්‍රනාන්දු වෙත ප්‍රදානය කරන ලදී. පරිගණක විද්‍යා උපාධි වැඩසටහනේ දී පරිගණක අධ්‍යයනය සඳහා මහාචාර්ය මොහාන් මුණසිංහ සම්මානය, කාර්මික පුහුණුව පිළිබඳ හොඳම කාර්ය සාධනය සඳහා වූ ඩේවිඩ් පිරිස් සමූහ ව්‍යාපාරයේ රන් පදක්කම හා හොඳම කාර්ය සාධනය සඳහා වූ Virtusa අධ්‍යයන විශිෂ්ටතා සම්මානය යන සම්මාන තුන පිළිවෙළින් සී. පන්කජන්; ශිෂ්‍ය ශිෂ්‍යාවන් හතර දෙනෙකුට ඒකාබද්ධව (ඩබ්.එල්. රණවීර, එම්.ජේ.එම්. ෂාසන්, ඩබ්.ඒ.ඒ.එම්. වීරසිංහ, ඩබ්.ඩී.එන්.වයි. ගුණතිලක) සහ ටී.එම්. ගමලත් යන අයට පිරිනමන ලද අතර අවසන් වසරේ හොඳම පරිගණක විද්‍යා ව්‍යාපෘතිය සඳහා වූ CINTEC සම්මානය එම්.ජේ.එම්. ෂාසන්ට පිරිනමන ලදී. තොරතුරු සන්නිවේදන තාක්ෂණ වැඩසටහනේ එච්.ඩී.එස්.ටී. විජේරත්න, ආර්.පී.එච්. විතානගේ සහ ටී.ජී.ඊ. පෙරේරා යන අය සඳහා පිළිවෙළින් හොඳම කාර්යසාධනය සඳහා වූ IFS අධ්‍යයන විශිෂ්ටතා සම්මානය,

කාර්මික පුහුණුවේ හොඳම කාර්යසාධනය සඳහා වූ ඩේවිඩ් පීරිස් සමූහ ව්‍යාපාරයේ රන් පදක්කම හා හොඳම කාර්යසාධනය සඳහා වූ මෝටරෝලා අධ්‍යයන විශිෂ්ටතා සම්මානය යන සම්මාන තුන පිරිනමන ලදී. තොරතුරු සන්නිවේදන තාක්ෂණ වැඩසටහනේ අවසන් වසරේ හොඳම ව්‍යාපෘතිය සඳහා වූ සම්පත් බැංකු සම්මානය එච්.ඩී.එස්.ටී. විජේරත්න සහ ජී.බී.අයි. ද සිල්වා යන අයට පිරිනමන ලදී.

අප විසින් බිහි කරනු ලබන ශිෂ්‍යයන්ගේ ගුණාත්මක භාවය කෙරෙහි එය දායක වන බැවින් යහපත් ශිෂ්‍යයන් ආකර්ෂණය කර ගැනීම අප සැලකිලිමත් වන මූලික කරුණ වේ. උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයන් තෝරා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC) විසින් මධ්‍යගතව සිදු කරයි. එය සිසුන්ගේ අභිමතය මත පදනම් වේ. වර්තමානයේ බොහෝ සිසුන්ගේ පළමු තේරීම ඉංජිනේරු හෝ වෛද්‍ය වේ. එසේම බොහෝ සිසුන් UCSC උපාධි වැඩසටහන් සහ පරිගණක ක්ෂේත්‍රයේ වෘත්තීය අවස්ථා පිළිබඳ නොදැනුවත්ය. එම නිසා දෙදින වැඩමුළු හැකියාව ඇති හොඳ සහභාගිත්වයකින් යුත් නව ඇතුළත් වීම් සඳහා සංවිධානය කිරීම නොනවත්වා UCSC කරගෙන යයි. මේ දක්වා අභ්‍යන්තර වැඩසටහන සඳහා ලියාපදිංචි වීමේ අවස්ථාව ඒ සඳහා උනන්දුවක් දක්වන්නන්ට හිමි වී නොමැත.

### පශ්චාත් උපාධි අධ්‍යාපනය

පශ්චාත් උපාධි වැඩසටහන් 1986 වසරේ දී පළමු වරට කොළඹ දී පිරිනමනු ලැබුවේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් හරහා ය. සමාලෝචිත වර්ෂය තුළ දී UCSC විසින් විශාරද උපාධි පාඨමාලා තුනක් (03) අඛණ්ඩව පවත්වන ලදී. පරිගණක විද්‍යා පාඨමාලාව හෝ පරිගණක පිළිබඳව ප්‍රථම උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් ඇති අය සඳහා අදහස් කළ පාඨමාලාවක් වන අතර තොරතුරු තාක්ෂණය පිළිබඳව වැඩසටහන උපාධිධාරීන් සහ වෙනත් විෂයන්වල වෘත්තිකයින් සඳහා සකස් කර ඇත. MIT වැඩසටහනට ඊ-ඉගෙනුම සහ බහු-මාධ්‍ය විෂයන් ඇතුළත් වේ. විද්‍යාවේදී තොරතුරු සුරක්ෂිතතාව වැඩසටහන නිර්මාණය කර ඇත්තේ තොරතුරු සුරක්ෂිතතා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමට බලාපොරොත්තු වන උපාධිධාරීන්ටය. මෙම වැඩසටහන මගින් තොරතුරු තාක්ෂණය, තොරතුරු පද්ධති විගණනය සහ තොරතුරු සුරක්ෂිතතාව යන ක්ෂේත්‍රවල නිරතවන්නන්ට මධ්‍ය වෘත්තීය අවස්ථා පිරිනමයි.

UCSC විසින් පිරිනමන දර්ශන විශාරද වැඩසටහන් වසර දෙකක අර්ධ කාලීන පාඨමාලා වන අතර අධ්‍යයන කාලපරිච්ඡේද හතරකින් සමන්විත වේ. 2013/2014 වර්ෂය සඳහා වූ ශිෂ්‍ය කණ්ඩායම සඳහා වූ පාඨමාලා 2014 ජනවාරි මස ආරම්භ කරන ලදී. 2014/2015 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම, තෝරා ගැනීමේ පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම තුළින් වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී. 2015 ජනවාරි මාසයේදී වැඩසටහන ආරම්භ කිරීම සඳහා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

සමස්තයක් ලෙස අභ්‍යන්තර කාර්ය මණ්ඩල සාමජිකයින් 30 දෙනෙක් සහ බාහිර කථිකාචාර්යවරුන් කීපදෙනෙක් මෙම වැඩසටහන සඳහා සිය දායකත්වය සැපයීය. මුළු විශාරද උපාධි ශිෂ්‍ය සංඛ්‍යාව 368කි. විශාරද වැඩසටහන්වලින් උපයා ගත් ආදායම සැලකිය යුතු මට්ටමකින් UCSC උත්පාදිත අරමුදල සඳහා දායක වූ අතර එය යටිතල පහසුකම් සහ පර්යේෂණ කටයුතු කෙරෙහි සහාය දැක්වීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

වර්තමානය වන විට UCSC විසින් විශාරද උපාධි වැඩසටහන් තුනක් පිරිනමන අතර පර්යේෂණ උපාධි සඳහා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 368 දෙනෙක් සිටියි (4වැනි වගුව). පරිගණක විද්‍යාපති උපාධි වැඩසටහන 1990 වර්ෂයේ සිට පිරිනමනු ලබන අතර මේ වන විට එහි ශිෂ්‍යයන් 149 දෙනෙක් සිටියි. තොරතුරු තාක්ෂණ වැඩසටහන 2000 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන අතර එහි ශිෂ්‍යයන් 166 දෙනෙක් සිටියි. තොරතුරු සුරක්ෂිතතා වැඩසටහන සඳහා සිටින ශිෂ්‍යයන් සංඛ්‍යාව 53කි. IBMBB සමගින් පිරිනමනු ලබන පළමු ජෛව-තොරතුරු වැඩසටහන සඳහා ශිෂ්‍යයන් 13දෙනෙක් සිටි අතර මෙම වසරේදී එය අවසන් කර ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඇත. පර්යේෂණ සිසුන් දර්ශනපති/දර්ශනශූරි උපාධි සඳහා සිය පර්යේෂණ කටයුතු පවත්වයි. වැඩිම පර්යේෂණ ශිෂ්‍ය සංඛ්‍යාවක් මෙම වර්ෂය තුළ දී උපාධි හිමිකර ගැනීම තුළින් පර්යේෂණ සම්බන්ධයෙන් ඇති අවධාරණය නිරූපණය වේ.

දර්ශනපති උපාධි වැඩසටහන සඳහා නවක සිසුන් (අර්ධ-කාලීනව 4 දෙනෙක් සහ පූර්ණ කාලීනව 5 දෙනෙක් වශයෙන්) හත් දෙනෙක් ලියාපදිංචි වූ අතර පූර්ණ කාලීන ශිෂ්‍යයන් හය දෙනෙක් දර්ශනපති උපාධි වැඩසටහනේ සිට දර්ශනශූරී උපාධි වැඩසටහන දක්වා උසස් කරන ලදී..

වගුව 4: පශ්චාත් උපාධි වැඩසටහන්

| පාඨමාලාව | ඇතුළත් කර ගැනීම 2013 | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | එකතුව | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යාපති | 81 | 81 | 68 | - | - | 149 | 42 |
| තොරතුරු තාක්ෂණපති | 100 | 100 | 66 | - | - | 166 | 46 |
| තොරතුරු සුරක්ෂිතතාවය පිළිබඳ විද්‍යාපති | 27 | 27 | 26 | - | - | 53 | 12 |
| පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - | - | - | - | 04 |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - | - | - | - | 02 |
| තොරතුරු සුරක්ෂිතතාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - | - | - | - | 01 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා හැදෑරූ** | **208** | **208** | **160** | **-** | **-** | **368** | **107** |
| දර්ශනශූරී | 02 | - | 02 | 03 | 02 | 07 | 01 |
| දර්ශනපති | 07 | 07 | 10 | 08 | 15 | 40 | 03 |
| **Total** | **217** | **215** | **172** | **11** | **17** | **415** | **110** |

සියලු පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි

**සම්මාන**

2014 සැප්තැම්බර් මස 23 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය පවත්වන ලදී. පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහනේ හොඳම ශිෂ්‍යයා සඳහා වූ Kingslake සම්මානය එම්.ආර්. යටවත්ත වෙත පිරිනමන ලද අතර තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති වැඩසටහනේ හොඳම ශිෂ්‍යා සඳහා වූ JICA සම්මානය ඩී.ජී.ආර්. දිල්රුක්ෂි වෙත පිරිනමන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සම්මානය (UCSC) – 2013 UCSC හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කේ.එල්. ජයරත්න වෙත පිරිනමන ලදී.

**බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා**

ආරම්භ කර ඇති බාහිර උපාධි පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් 6,235ක් බඳවා ගත් අතර ශිෂ්‍යයන් 389ක් ව්‍යාප්ති පාඨමාලා හැදෑරීය. මෙයට අමතරව UCTIT සහ UTEL වැඩසටහන්වල ශිෂ්‍යයන් 13,814 දෙනෙක් විභාගවලට පෙනී සිටියහ. FIT වැඩසටහන සඳහා ශිෂ්‍යයන් 930ක් ලියාපදිංචි වූ අතර වසර තුළ ශිෂ්‍යයින් පිළිවෙළින් 10,995 දෙනෙක් සහ 5,283 දෙනෙක් විභාගවලට පෙනී සිටියේය. FIT වැඩසටහනෙහි ලියාපදිංචි ශිෂ්‍යයන් 830 දෙනෙක් සිටි අතර වසර තුළදී 906 දෙනෙක් විභාගවලට පෙනී සිටියේය. ඊ-ඉගෙනුම් මධ්‍යස්ථානය වසර තුළදී UGC සහ KPMG සඳහා මාර්ගගත විභාග පවත්වන ලදී. BIT වැඩසටහන ආරම්භයේ සිට ශිෂ්‍යයින් 31,561ක් ආකර්ෂණය කරගෙන ඇති අතර උපාධිධාරීන් 1,661 දෙනෙක් ද උසස් ඩිප්ලෝමාධාරීන් 3,127 දෙනෙක් ද ඩිප්ලෝමාධාරීන් 6,518 දෙනෙක් ද බිහි කර ඇත. 2013/14 දී නව බඳවා ගැනීම් 2379ක් සිදු කළ අතර ඉහළම උපාධිධාරීන් සංඛ්‍යාවක් බිහි කර ඇත (5 වැනි වගුව). 2014/15 සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය ද වසර තුළ ආරම්භ කළ අතර වසර අවසානයට පෙර 1500කට වඩා වැඩි බඳවා ගැනීම් ගණනක් සිදු කරන ලදී.

වගුව 5: බාහිර උපාධි වැඩසටහන් 2013/14

| පාඨමාලාව | ඇතුළත් කර ගැනීම | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | එකතුව | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා | 2379 | 3058 | 1154 | 323 | 4535 | 5 |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමා | 721 | 1154 | 486 | 943 | 2583 | 3<br>3 |
| තොරතුරු තාක්ෂණවේදී | 347 | 323 | 620 | 594 | 1537 | 2 |
| **මුළු ගණන** | | **4535** | **2260** | **1860** | **8655** | |

ඉලක්ක සමඟම ලියාපදිංචි සහ උපාධි ලත් සංඛ්‍යාව හඳුනා ගනිමින් පසුගිය වර්ෂ තුන පුරා BIT ශිෂ්‍යයන්ගේ කාර්ය සාධනය, වගුව 6 න් ඉස්මතු කර දක්වයි.

විෂයමාලා වෙනස් කිරීම් පැහැදිලි කිරීම සඳහා සහ ආයතනික ප්‍රතිචාර ලබා ගැනීම සඳහා අප්‍රේල් මස 30වැනි දින BIT ආයතනික රැස්වීම පවත්වන ලදී. BIT විභාග පරීක්ෂණ කොළඹ, නුවර, ගාල්ල සහ යාපනයේ දී පවත්වන ලදී.

වගුව 6: පසුගිය වර්ෂ තුන පුරා බාහිර උපාධි කාර්ය සාධනය

| බාහිර උපාධි අපේක්ෂකයන් | KPI | 2011/12 | 2012/13 | 2013/14 |
|---|---|---|---|---|
| DIT - නව ඇතුළත් කර ගැනීම | **2000** | 2365 | 2034 | 2379 |
| DIT – ලියාපදිංචි වූ | 4000 | 4287 | 4175 | 4535 |
| DIT - ඩිප්ලෝමා | **600** | **654** | **611** | **515** |
| HDIT - උසස් ඩිප්ලෝමා ඇතුළත් කර ගැනීම | **600** | 648 | 714 | 721 |
| HDIT - උසස් ඩිප්ලෝමා ලියාපදිංචි වූ | 2000 | 2019 | 2391 | 2260 |
| HDIT - උසස් ඩිප්ලෝමා | **300** | **262** | **305** | **339** |
| BIT - උපාධි ඇතුළත් කර ගැනීම | **300** | 279 | 312 | 347 |
| BIT - උපාධි ලියාපදිංචි වූ | 1500 | 1293 | 1416 | 1860 |
| BIT - උපාධිධාරීන් | **200** | **172** | **194** | **225** |

**උපාධි ප්‍රදානය**

2014 පෙබරවාරි 10 වන දින පවත්වන ලද 2013 උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වූවන්ගේ කාර්යසාධනය වගුව 7 හි පෙන්වා ඇත. මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිධාරීන් 194 දෙනෙකුට උපාධි පිරිනමන ලදී. ඔවුන්ගේ ව්‍යාපෘති විභාගවලින් මාස තුනකට පසුව පැවැත් වූ රැකියා සමීක්ෂණයට 181 (93%) දෙනෙක් ප්‍රතිචාර දැක් වූහ. 139 දෙනෙක් (77%) දැනටමත් රැකියාවල නිරත වූ අතර ඔවුන්ගෙන් 24 දෙනෙක් (13%) වඩාත් හොඳ රැකියා සොයමින් සිටියහ. 9 දෙනෙක් (5%) සිය අධ්‍යාපන කටයුතු දිගටම කර ගෙන යන අය වූ අතර අනෙක් අය රැකියා නොමැති වීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළේ නැත. පසුගිය වසර දෙක ඇතුළත රැකියා නියුක්ති ප්‍රතිශතය පිළිවෙළින් 81%ක් සහ 87%ක් විය. කෙසේ වුවද ඊළඟ ශිෂ්‍ය කණ්ඩායමේ ප්‍රතිඵල නිකුත්වීමත් සමඟ 225ක වාර්තාගත ශිෂ්‍ය සංඛ්‍යාවක් BIT උපාධිය සඳහා සුදුසුකම් ලැබූහ.

වගුව 7: 2014 දී පැවති උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි ලැබූවන්

| ඇතුළත් | පළමු | ඉහළ | පහළ | සමත් | මුළු |
|---|---|---|---|---|---|
| BIT | - | 7 | 11 | 176 | **194** |

**සම්මාන**

තොරතුරු තාක්ෂණවේදී (බාහිර) උපාධියේ විශිෂ්ටතම කාර්යසාධනය සඳහා පිරිනමන මහාචාර්ය වී.කේ. සමරනායක පදක්කම ඩබ්.ටී.ඩී. පෙරේරා වෙත ප්‍රදානය කරන ලදී. විශිෂ්ටතම තනි පුද්ගල ව්‍යාපෘති සම්මානය ටී.ඩබ්.ටී.ටී. විමලසිරි වෙත පිරිනමන ලදී. එම්.ජේ.පී.යූ. සමන්තිලක අනුස්මරණ සම්මානය කේ.එච්.එම්. ඉර්ෂාඩ් වෙත ප්‍රදානය කරන ලදී. අර්ධ වර්ෂ 4 සඳහා විශිෂ්ටතම e-Learner සම්මාන පිළිවෙළින් එස්.ඒ.සී.එස්. මුතුකුමාරණ, බී.ආර්.ආර් ගුණසේන, එච්.එල්.එස්.ඊ. සමරසිංහ සහ බී.එම්.ඩී.එන්. බස්නායක වෙත පිරිනමන ලදී.

**ආයතන**

බොහෝ පුහුණු කිරීමේ ආයතන BIT අපේක්ෂකයන් සඳහා මුහුණට මුහුණ පන්ති සහ ඉගෙනුම් සහාය පිරිනමයි. මෙම ක්‍රියාදාමය සඳහා 200 කට අධික ආයතන සංඛ්‍යාවක් සහභාගී වන අතර සමහර අධ්‍යයන වර්ෂවල ආයතන 50 ක් පමණ වේ. UCSC එම ආයතන වෙත බලය පවරන්නේ නැති නමුත් වැඩසටහනේ ප්‍රගමනයට ඔවුන්ගේ දායකත්වය හඳුනා ගනී. සෑම වසරකම UCSC එක් එක් පාඨමාලාවල ආයතන අනුව විභාග ප්‍රතිඵල සාරාංශයක් ප්‍රකාශයට පත් කරයි. එම නිසා අයදුම්කරුවන්ට තිබෙන ආයතන හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ඉගෙනුම් ක්‍රමය සැලසුම් කිරීමට හැකි වේ. අයදුම්කරුවන්ගෙන් හරි අඩකට වඩා වැඩි සංඛ්‍යාවක් ඔවුන් විසින්ම VLE සහ මාර්ගගත/නිර්දේශිත ද්‍රව්‍යවල සහායෙන් හැදෑරීම සිදු කරයි. 2013/14 දී, දිස්ත්‍රික්ක 13කින් ආයතන 36ක් අයදුම්කරුවන් පස් දෙනෙකුට හෝ ඊට වැඩි පිරිසකට පුහුණු කිරීම් පැවැත්වීය. ඒ අතුරින් ආයතන 12ක් අවුරුදු තුන සඳහාම සම්බන්ධ විය (වගුව 8 හි * ලෙස ලකුණු කොට ඇත).

වගුව 8: BIT වැඩසටහන සමග සම්බන්ධ වූ ආයතන

| දිස්ත්‍රික්කය | ආයතනය |
|---|---|
| අම්පාර | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්, කල්මුණේ |
| මඩකලපුව | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස් |
| කොළඹ | (1) අවුරෝරා කොම්පියුටර් ස්ටඩීස්, මහරගම<br>(2) * ඊ-ඇකඩමි කොම්පියුටර් එඩියුකේෂන් සෙන්ටර්, කොළඹ 06<br>(3) * අර්ත් ඉන්ටර්නැෂනල්, කොළඹ 08<br>(4) ඊජ්එස්එල් ජේ ලන්කා කොම්පියුටර් ට්‍රේනින් ඉන්ස්ටිටියුට්, කොළඹ 08<br>(5) * ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්, කොළඹ 04<br>(6) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්, නුගේගොඩ<br>(7) *ෆවුන්ඩේෂන් ඔෆ් අයිටී ප්‍රොෆෙෂනල්ස්, පන්නිපිටිය<br>(8) *අයිඩීඑම් කොම්පියුටර් ස්ටඩීස්, කොළඹ<br>(9) *මැට්‍රික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් අයිටී, කොළඹ 04<br>(10) *ඕපන්ආක් ස්කූල් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජී, කොළඹ<br>(11) ටෙක් ශ්‍රී ලංකා<br>(12) *වයිඩ්අවේක් සොලියුෂන්ස්, පැපිලියාන |
| ගාල්ල | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස් |
| ගම්පහ | (1) *අර්ත් ඉන්ටර්නැෂනල්<br>(2) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්, ගම්පහ<br>(3) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්, මීගමුව<br>(4) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්, කිරිබත්ගොඩ |

| | |
|---|---|
| යාපනය | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) ජැෆ්නා කොලේජ් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි<br>(3) *MIS BIT කැම්පස්<br>(4) *Mobile@Net කොම්පියුටර් සර්විසස් |

| | |
|---|---|
| නුවර | (1) * ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) මැට්‍රික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් අයිටී<br>(3) නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් කෝපරේටිව් ඩිවෙලොප්මන්ට් |
| කෑගල්ල | (1) ඉන්ස්ටිටියුට් ඔෆ් කොම්පියුටර් ස්ටඩීස්<br>(2) සොලාරිස් කොම්පියුටර් ස්ටඩීස් |
| කුරුණෑගල | (1) * ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස් |
| මාතර | (1) ඩීබේස් ස්කූල් ඔෆ් කොම්පියුටින්ග්<br>(2) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස්<br>(3) අයිඩීඑම් කොම්පියුටර් ස්ටඩීස් |
| නුවර එළිය | (1) iWAVE- ගිනිගත්හේන |
| රත්නපුරය | (1) IT වෘත්තිකයන්ගේ පදනම<br>(2) ITsoft කොම්පියුටර් ස්ටඩීස්, බලන්ගොඩ |
| ත්‍රිකුණාමලය | (1) ඊසොෆ්ට් කොම්පියුටර් ස්ටඩීස් |

UCSC විසින් ව්‍යාප්ති සහතික පත්‍ර පාඨමාලා නවයක් පිරිනමන ලද අතර සිසුන් 400කට ආසන්න සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගන්නා ලදී. පසුගිය වසර කිහිපය තුළ සංඛ්‍යාවෙහි අඩුවක් තිබූ නමුත් 2014 දී මද වශයෙන් වැඩි දියුණු වීමක් දක්නට ලැබිණි. UCSC විසින් පවත්වනු ලබන CSC පාඨමාලා (වැඩසටහන්) විස්තර වගුව 9 මගින් දැක්වෙයි. (D – කාල සීමාව දිනවලින්; B – ශිෂ්‍ය කාණ්ඩ සංඛ්‍යාව; P – මුළු සහභාගිවන්නන්).

වගුව 9: CSC පුහුණු පාඨමාලා

| පාඨමාලාව | 2013 | D | B | P |
|---|---|---|---|---|
| JavaSE භාවිතයෙන් ජාවා යෙදුම් සංවර්ධනය | 35 | 8 | 4 | 89 |
| JavaEE භාවිතයෙන් උසස් ජාවා යෙදුම් සංවර්ධනය | 51 | 8 | 3 | 67 |
| Unix Linux ජාල සහ පද්ධති පරිපාලනය | 78 | 5 | 3 | 71 |
| උසස් බහුමාධ්‍ය වෙබ් නිර්මාණකරණය සහ සංවර්ධන ශිල්ප ක්‍රම | 28 | 8 | 2 | 39 |
| AutoCAD 2010 භාවිතයෙන් පරිගණක සහායයෙන් සැලසුම් ඇඳීම | 36 | 8 | 1 | 18 |
| ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංගය | - | 2 | 1 | 24 |
| Joomla භාවිතයෙන් වෙබ් නිර්මාණකරණය | - | 2 | 1 | 7 |
| නිදහස් සහ විවෘත මූලාශ්‍ර මෘදුකාංග | - | 2 | 2 | 64 |
| ජංගම යෙදුම් ආරක්ෂාව | - | 4 | 1 | 10 |
| වෙනත් | 81 | - | - | - |
| **එකතුව** | **309** | **47** | **18** | **389** |

### විදේශීය ශිෂ්‍යයන්

කලාපය තුළ විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස පිළිගැනීම සඳහා විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීම වැදගත්ය. විදේශීය සිසුන් ලියාපදිංචි කිරීමේ ප්‍රවර්ගය තිබුණද වෙනත් ස්ථානයක උ/පෙ කළ සිසුන් වුවත් මෙතෙක් අයදුම් කර ඇත්තේ දේශීය සම්බන්ධතා මතය. 2011 දී විදේශීය සිසුන් ප්‍රවර්ගය යටතේ පළමු සිසුවා CS උපාධි

පාඨමාලාව සඳහා ලියාපදිංචි විය. 2013 වසරේ දී තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති වැඩසටහන සඳහා ප්‍රථම විදේශ ශිෂ්‍යයා භූතානයෙන් විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා ලද අතර ඉන් අනතුරුව තොරතුරු සුරක්ෂිතතා විද්‍යාව පිළිබඳ විද්‍යාපති වැඩසටහන සඳහා පකිස්තානු ජාතික ශිෂ්‍යයෙක් බඳවා ගත්ත ද ඔහු පළමු සමාසිකයෙන් පසුව විශ්වවිද්‍යාලය හැර ගියේය. මෙම වසරේ දී නයිජීරියානු ජාතික ශිෂ්‍යයෙක් වැඩසටහන සඳහා එක් විය. විදේශ සිසුන් බඳවා ගැනීම පිළිබඳ තොරතුරු 10වැනි වගුවේ දැක් වේ.

වගුව 10: විදේශීය ශිෂ්‍යයන්

| පාඨමාලාව | මාධ්‍යය | ඇතුළත් කර ගැනීම | 1 වන වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යාව | ඉංග්‍රීසි | - | - | - | 01 | - | - |
| MIT | ඉංග්‍රීසි | 01 | 01 | 01 | - | - | - |

### ආරම්භ කළ නව පාඨමාලා

විෂයමාලා සංශෝධනය හා උපාධි වැඩසටහන්වල වෙනස් කිරීම් හේතුවෙන් BICT වැඩසටහන BIS ලෙස නැවත නම් කරන ලදී. කෙසේ වුව ද මෙම පාඨමාලාවට සමාන පාඨමාලාවක් එයට පෙර ක්‍රියාත්මක වූ බැවින් මෙම පාඨමාලාව නව පාඨමාලාවක් ලෙස සැලකිය නොහැකිය. කෙසේ වුවද පරිගණක විද්‍යාව පිළිබඳ නව විද්‍යාවේදී උපාධියේ ශිෂ්‍ය කණ්ඩායමට වසර 2015 දී ඔවුන්ගේ 3වන වසරේදී නව මෘදුකාංග ඉංජිනේරු ශිල්පය තෝරා ගැනීමට අවස්ථාවක් ලැබෙනු ඇත. උපාධිය දක්වා දිවෙන නව සහතිකපත් වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර නිපුණතා වැඩසටහන (ICIT) පැවැත්වීමට FITIS, NODES සහ UCSC අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. වැඩසටහන 2015 දී ආරම්භ කිරීමට අපේක්ෂිතය.

වගුව 11: නව පාඨමාලා

| පාඨමාලාව | මාධ්‍යය | සහතික | උපාධි | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | විශාරද | දර්ශනපති | දර්ශනශූරි |
|---|---|---|---|---|---|---|---|
| මෘදුකාංග ඉංජිනේරු | ඉංග්‍රීසි | - | 1 | - | - | - | - |
| ICIT | ඉංග්‍රීසි | 1 | - | - | - | - | - |

## පර්යේෂණ

### පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන

විවිධ පර්යේෂණ කණ්ඩායම් යටතේ හා පර්යේෂණ ශිෂ්‍යයන් හරහා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක වෙයි (වගුව 13). UCSC ප්‍රධානවම පර්යේෂණ කටයුතුවල උන්නතියට යොමු වන දර්ශනපති වැඩසටහන් සඳහා පූර්ණකාලීන/ අර්ධකාලීන (FT/ PT) පරිගණක විද්‍යාව/ඉංජිනේරු උපාධිවලට යහපත් පළමු ප්‍රථම උපාධි ප්‍රතිඵල සහිත උපාධිධාරීන් ඇතුළත් කර ගනී. වර්ෂය තුළදී නවක සිසුන් 7 දෙනෙකු ලියාපදිංචි වූ අතර 7 දෙනෙක් දර්ශනපති උපාධි සිට දර්ශනශූරී උපාධි දක්වා උසස් කරන ලදී. වර්තමානයේදී UCSC හි ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් 19 දෙනෙක් සහ බාහිර පර්යේෂකයන් 9 දෙනෙක් යටතේ සිසුන් 40 දෙනෙකු විෂය ධාරා 22 ක්

යටතේ වැඩ කරයි. දර්ශනපති/දර්ශනශූරී උපාධි සඳහා යොමු වූ පර්යේෂණ 18ක් මේ වන විට අවසන් කර ඇත. මෙම වසර තුළ දර්ශනපති/දර්ශනශූරී ශිෂ්‍යයන් 21 දෙනෙකුගේ ප්‍රකාශන තිබුණි.

සමාජ ජීවිත ජාල පර්යේෂණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස දෙසැම්බර් මාසයේ දී වෙස්ටර්න් සිඩ්නි විශ්වවිද්‍යාලයේ ආචාර්ය ගිනිගේ දින කීපයක් ගත කිරීමට ශ්‍රී ලංකාවට පැමිණියේය. මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සමන් හල්ගමුගේ විසින් "ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත හා සුචි පර්යේෂණ පැතිකඩ වර්ධනය කිරීම සඳහා අවස්ථාවක්" යන මාතෘකාව යටතේ ආරාධිත දේශනයක් පවත්වන ලදී.

වගුව 12: කාර්ය මණ්ඩල පර්යේෂණ ක්ෂේත්‍ර

| පර්යේෂණ ක්ෂේත්‍රය | FT | PT | එකතුව | නව | සම්පූර්ණ කළ |
|---|---|---|---|---|---|
| කෘත්‍රිම බුද්ධිය | 1 | 2 | **3** | 0 | 0 |
| පරිගණක ග්‍රැෆික් | 1 | 2 | **3** | 0 | 0 |
| දත්ත කැණීම | 2 | 0 | **2** | 1 | 0 |
| අංකිත අධිකරණ වෛද්‍ය විද්‍යාව | 1 | 0 | **1** | 0 | 0 |
| ඊ-ඉගෙනුම | 2 | 4 | **6** | 0 | 0 |
| ක්‍රීඩා පදනම් ඉගෙනුම | 0 | 1 | **1** | 0 | 0 |
| භූගෝලීය තොරතුරු පද්ධති | 0 | 1 | **1** | 0 | 0 |
| හරිත තොරතුරු තාක්ෂණය | 1 | 0 | **1** | 0 | 0 |
| හියුරිස්ටික ප්‍රශස්තකරණය | 0 | 1 | **1** | 0 | 0 |
| අනුරූ පිරිසැකසුම | 0 | 1 | **1** | 0 | 0 |
| තොරතුරු පද්ධති | 3 | 0 | **3** | 1 | 0 |
| බුද්ධිමය පද්ධති | 0 | 1 | **1** | 0 | 0 |
| දැනුම් ඉංජිනේරුකරණය | 1 | 0 | **1** | 0 | 0 |
| යන්ත්‍ර ඉගෙනුම | 1 | 0 | **1** | 0 | 0 |
| ජංගම ඉගෙනුම | 1 | 0 | **1** | 0 | 0 |
| බහුමාධ්‍ය | 3 | 0 | **3** | 3 | 0 |
| ස්වභාවික භාෂා පිරිසැකසුම | 3 | 0 | **3** | 0 | 0 |
| සංවේදක ජාල | 0 | 1 | **1** | 0 | 0 |
| සමාජ විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය | 0 | 3 | **3** | 2 | 0 |
| මෘදුකාංග ඉංජිනේරුකරණය | 0 | 3 | **3** | 0 | 0 |
| **TOTAL** | **20** | **20** | **40** | **07** | **04** |

UCSC හි පර්යේෂණ නගා සිටුවීම සඳහා පර්යේෂණ අරමුදලක් 2009 උපයෝගීතා මෙහෙයුම් මාර්ගෝපදේශ සමඟින් පිහිටුවනු ලැබිණි. මිලියන 4ක ආරම්භක දායකත්වය දර්ශනපති සහ BIT වෙතින් වූ මෙම අරමුදල උත්පාදිත අරමුදල් හරහා අඛණ්ඩව වර්ධනය වී ඇති අතර එය දැන් මිලියන 95ක්ව පවතී. ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයට පර්යේෂණ හමු සඳහා සහභාගී වීමට සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සඟරාවල පර්යේෂණ පළ කිරීම සඳහා වාර්ෂිකව පිළිවෙළින් රු. 350,000 සහ රු. 200,000 දක්වා උපයෝජනය කර ගත හැකි විය. පර්යේෂණ ජයග්‍රහණ සඳහා දිරිමත් කිරීමට 100,000 ක අමතර පංගුවක්ද හඳුන්වා දෙන ලදී. මෙය, වාර්ෂික UCSC ප්‍රකාශන 30 සිට 60 දක්වා වැඩි කරන ලදී. වර්ෂයේ ප්‍රකාශන අතුරින් 56ක් රටවල් 12ක පවත්වන ලද සම්මන්ත්‍රණ වේ. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 24 (60%) දෙනෙක් පර්යේෂණ පළ කළහ. ප්‍රකාශනවල විස්තර වගුව 13 න් දැක් වේ.

ප්‍රකාශනවලට පහත කාර්ය මණ්ඩල විසින් සම-කර්තෘත්වය දක්වන ලද පත්‍රිකා 86 ක් ඇතුළත් විය.: ජී.එන්. වික්‍රමනායක (10), ඒ.ටී. ධර්මරත්න (8), ජී.තේ.ඒ. ඩයස් (8), එන්.ඩී. කොඩිකාර (7), කේ.එල්. ජයරත්න (6), ඩී.එන්. රණසිංහ (5), වයි. ඒකනායක (4), ජේ.එස්. ගුණතිලක (4), කේ.පී. හේවාගමගේ (4), ඒ.ආර්. වීරසිංහ (4), එල්.එන්.සී. ද සිල්වා (3), කේ.ටී.එන්. ද සොයිසා (3), සී.අයි. කැප්පෙටිගම (3), ඩබ්.එම්.කේ.ජී. වීරසිංහ

(3), එස්.එම්.කේ.ඩී. අරුණතිලක (2), එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු (2), ඩී.ඩී. කරුණාරත්න (2), ජී.ඩී.එස්.පී. විමලරත්න (2), ඩී.ඒ.එස්. අතුකෝරාළ (1), එච්.ඒ. කල්දේරා (1), ආර්.එස්. මදනායක (1), එස්.පී. මාතරආරච්චි (1), එච්.එල්. ප්‍රේමරත්න (1), ආර්.එම්.පී.එන්. සෝමරත්න (1).

Table 13: Research Summary

| විෂයය | පළ කළ | වාණිජකරණය කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පර්යේෂණ සංඛ්‍යාව | 107 | - | 56 |
| නවෝත්පාදන | - | - | - |
| සඟරා සංඛ්‍යාව | 11 | - | - |
| පොත් සංඛ්‍යාව | - | - | - |
| ලිපි සංඛ්‍යාව | 56 | - | - |
| වෙනත් | - | - | - |
| එකතුව | **67** | - | **56** |

**සම්මේලන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු**

අදාළ පර්යේෂණ හඳුනා ගැනීමට සහ කර ගෙනයාමට අවශ්‍ය යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම UCSCහි තවත් අරමුණක් වේ. මේ අනුව අවසන් වසරේ ශිෂ්‍යයින්ගේ ද සහභාගීත්වය ඇතිව මාර්තු මස 28වැනි දින 6වැනි UCSC පර්යේෂණ පරිසංවාදය සාර්ථවක පැවති අතර මෙහි දී ICT ජර්නලයේ කලාප තුනක් නිකුත් කරන ලදී. 2014 වසරේ දෙසැම්බර් මස 11-12 දක්වා පැවති නැඟී එන කලාප සඳහා වූ අන්තර්ජාතික තොරතුරු තාක්ෂණ සම්මන්ත්‍රණය ද UCSC මඟින් සංවිධානය කළ අතර දෙසැම්බර් මස 10 සිට 13 දක්වා පැවති පූර්ව හා පශ්චාත් සම්මන්ත්‍රණ වැඩමුළු මෙයට ඇතුළත් විය. එමෙන්ම UCSC විසින් පර්යේෂණ සඳහා වැඩිදුර දායකත්වය දිරිමත් කිරීම පිණිස සියලුම විද්‍යාර්ථීන් විසින් පර්යේෂණ අරමුදල උපයෝජනය කර ගැනීම වෙනුවෙන් වූ යාන්ත්‍රණය සමාලෝචනය කරන ලදී. අරගල ප්‍රතිචාර හා කළමනාකරණය සඳහා වූ තොරතුරු පද්ධති පිළිබඳ 2වැනි ආසියානු සම්මන්ත්‍රණය (ISCRAM) UCSCහි දී ජූනි මස 20-21 දක්වා පැවති අතර සැප්තැම්බර් මස 1-26 දක්වා ISSALE සමර් ස්කූල්ද සාර්ථකව පවත්වන ලදී.

එමෙන්ම UCSC විසින් 2014 ජූලි මස 23වැනි දින වාර්ෂික මහාචාර්ය වී.කේ. සමරනායක අනුස්මරණ දේශනය UCSC හි දී පවත්වන ලදී. මෙහි දී දේශක මහාචාර්ය අභය ඉඳුරුව මහතා "බුද්ධිමත් අනාගතය" යන මැයෙන් යුත් දේශනයක් පවත්වන ලද අතර ඔහු මහාචාර්ය වී.කේ. සමරනායක පුණ්‍යස්ථාපන අරමුදල යටතේ පළමු පුණ්‍යස්ථාපන සභාපතිවරයා ලෙස තෝරා ගන්නා ලදී. ඔහු 2014 ජූලි මස 24වැනි දින සිට අගෝස්තු මස අවසානය දක්වා සති හයක කාලයක් දිව ගිය සිය පළමු සංචාරය ගත කළේය. සම්මන්ත්‍රණයේ, සමුළුවල සහ වැඩමුළුවල විස්තර කාර්ය මණ්ඩල ඉදිරිපත් කිරීම් සමඟ 14වැනි වගුවේ දක්වා ඇත.

වගුව 14: සම්මන්ත්‍රණ, සමුළු සහ වැඩමුළු

| විෂයය | සහභාගි වූ | පළකළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ විද්වතුන්ගේ දේශීය සම්මන්ත්‍රණ | 20 | 5 | 1 |
| ජ්‍යෙෂ්ඨ විද්වතුන්ගේ ජාත්‍යන්තර | 15 | 31 | 17 |

| | | | |
|---|---|---|---|
| සංවිධානය කළ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICTer) | 199 | 21 | - |
| ICTer සඟරාව | 5 | 3 | - |
| **එකතුව** | **239** | **60** | **18** |

### ලද සම්මාන

UCSC විසින් ජාතික සහ ජාත්‍යන්තර තරඟවලට සහභාගී වීම සඳහා සිය ශිෂ්‍යයන්ට අඛණ්ඩව දිරිමත් කරන ලදී. ජයග්‍රහණ අත්කර ගත් ශිෂ්‍යයන්ගේ විස්තර ශිෂ්‍ය ජයග්‍රහණ යටතේ ලැයිස්තුගත කර ඇත. එමෙන්ම UCSC විසින් කාර්ය මණ්ඩල පර්යේෂණ නිපැයුම් ද දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් තරඟ කිරීමට දිරිමත් කරවයි. UCSC කාර්ය මණ්ඩලය NBQSA පර්යේෂණ හා සංවර්ධන කාණ්ඩයේ ලෝකඩ හා කුසලතා සම්මාන දිනා ගන්නා ලදී. කාර්ය මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද "සියරා" වරාය නෞකා ගමනාගමන කළමනාකරණ පද්ධතිය, තීක්ෂණ ආයතනය විසින් ශ්‍රී ලංකාවේ අපරාධ වාර්තා අංශය සමඟ එක්ව ඊ-රාජ්‍ය හා ආයතන කාණ්ඩය සඳහා නිෂ්පාදනය කළ ස්වයංක්‍රීය ඇඟිලි සලකුණු හඳුනා ගැනීමේ ක්‍රමය (AFIS) මෙම ජයග්‍රහණ අතර විය. UCSC හි මෘදුකාංග ගොඩනැගීමේ ඒකකය විසින් නිෂ්පාදිත හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රමය සඳහා වූ ඊ-රාජ්‍ය හා ආයතන කාණ්ඩය විශේෂ කුසලතා සම්මානය දිනා ගන්නා ලදී. සඳරුවන් විසින් තාක්ෂණික සංවර්ධන අංශයෙන් අත් කර ගත් ජයග්‍රහණ වෙනුවෙන් නොවැම්බර් මස 11වැනි දින කැපීපෙනෙන තරුණ තැනැත්තන් දස දෙනා සඳහා වූ TOYP 2014 සම්මානය දිනා ගන්නා ලදී. මෙයට අමතරව කාර්යමණ්ඩලයේ කීපදෙනෙක්ම ඔවුන්ගේ පර්යේෂණ කටයුතු කර ගෙන යාම පිණිස NSF සහ NRC ප්‍රදාන ලබා ගන්නා ලදී.

http://www.slrail.info යන වෙබ් අඩවිය ජූනි මස 2වැනි දින දියත් කරන ලදී. මෙය ආචාර්ය කසුන් ද සොයිසා විසින් අධීක්ෂණය කළ පර්යේෂණයක ප්‍රතිඵලයකි. මෙමඟින් දකුණු දුම්රිය මාර්ගයේ දුම්රිය පැමිණීමේ වේලාව සහ වේගය අනුව දුම්රිය ගමන් මඟ නිරීක්ෂණය කිරීමට මහජනයාට හැකියාව ලබා දෙයි. Q4 ප්‍රදානයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම පිණිස ලෝක බැංකු කණ්ඩායම පෙබරවාරි මස 20 සහ 24වැනි දිනවල චාරිකාවක් සිදු කරන ලදී. ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධයෙන් ඔවුන් සෑහීමකට පත් වූ අතර සෑහීමකට පත්විය හැකි ප්‍රගතියක් අත් කර ගෙන ඇත්තේ අපගේ ව්‍යාපෘතිය පමණක් වන බවට අදහස් පළ කළේය. ලෝක බැංකුව විසින් HETC අරමුදල් යටතේ ක්‍රියාත්මක කළ UCSC ව්‍යාපෘතියක විස්තර ඇසුරෙන් "මගේ ප්‍රාර්ථනාව සඵල විය: ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල නවෝත්පාදනය" යන මැයෙන් වූ ලිපියක් පළ කරන ලදී.

වගුව 15: ලද සම්මාන

| විෂයය | සම්මාන සංඛ්‍යාව | අධ්‍යාපනඥයන් සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය සම්මාන | - | - | - |
| ජාතික සම්මාන | 16 | 6 | 43 |
| ජාත්‍යන්තර සම්මාන | 5 | 2 | 4 |
| වෙනත් | - | - | - |
| එකතුව | **20** | **8** | **47** |

### අධ්‍යයන කාර්ය මණ්ඩලය

අධ්‍යයන නිවාඩු ලබා ගෙන සිටි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙක් ඉල්ලා අස් වූහ. වසර තුළ දී (ආධුනික) කථිකාචාර්යවරු පස් දෙනෙක් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු තිදෙනෙක් සඳහා පසුගිය වසරේ දී

පැවති සම්මුඛ සාකච්ඡා පදනම් කර ගෙන පත්වීම් ලබා දෙන ලදී. එක් කථිකාචාර්යවරයෙක් පසුව ඉල්ලා අස් විය. කථිකාචාර්යවරයෙක් (ආධුනික) පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීමට අසමත් වීමේ පදනම මත සේවය අවසන් කරන ලදී. කර්මාන්තය තුළ දක්නට ලැබෙන ආකර්ෂණීය පාරිශ්‍රමික හේතුවෙන් UCSC සියලුම අධ්‍යයන තනතුරු පිරවීමට නොහැකි වී තිබේ. අධ්‍යයන සහ අධ්‍යයන සහායක තනතුරු 82කින් 40ක් පමණක් සම්පූර්ණ කරන ලදී. පෞද්ගලික ක්ෂේත්‍රයේ ඉතා හොඳ අපේක්ෂාවන් ඇති බැවින් තාක්ෂණික පුහුණුව ලැබූවන් රඳවා ගැනීම සහ හොඳ තරුණ ශාස්ත්‍රඥයින් ආකර්ෂණය කර ගැනීම අතිශයින් දුෂ්කරය. ස්ථිර කාර්ය මණ්ඩලය දවසේ වැඩකටයුතු කරගෙන යන අතරතුර UCSC තොරතුරු පද්ධති උපාධි වැඩසටහනේ සමහර පාඨමාලා සඳහා බාහිර කාර්ය මණ්ඩලය කෙරෙහි විශ්වාසය තබයි.

ජාත්‍යන්තර මට්ටමේ මානව සම්පත් ආකර්ෂණය කර ගැනීම පිණිස ඕස්ට්‍රේලියාව, ස්වීඩනය සහ එක්සත් රාජධානිය යන රටවල්වලින් පැමිණි බාහිර පර්යේෂකයින් සඳහා මෙම වසර තුළ සත්කාරකත්වය දක්වා ඇත. විශේෂයෙන්ම මෑතකදී පිහිටුවන ලද ප්‍රදාන අරමුදල හරහා මහාචාර්ය ඉදුරුව සඳහාය.

UCSC විසින් කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහනද ස්වීඩනයේ උමියා විශ්වවිද්‍යාලයේ Linuaeus Palme ව්‍යාපෘතිය යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර UCSC කාර්ය මණ්ඩල සාමාජිකයෙක් සාර්ථකව උමියා විශ්වවිද්‍යාලය තුළ පාඨමාලාවක් මෙහෙය වූයේය.

UCSC අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර වගුව 16 හි දැක් වේ.

වගුව 16: කාර්ය මණ්ඩල පර්යේෂණ ක්ෂේත්‍ර

| විෂයයන් | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහාය කථිකාචාර්ය | උපදේශක |
|---|---|---|---|---|---|---|---|
| පරිගණකකරණය (P) | ඉංග්‍රීසි | - | 03 | 20 | 15* | - | 02 |
| පරිගණකකරණය (C) | ඉංග්‍රීසි | - | - | - | - | 06 | 18 |

*04 දෙනෙක් නිවාඩු ලබා ඇත

**අනධ්‍යයන කාර්ය මණ්ඩලය: ස්ථිර (P) කොන්ත්‍රාත්/පැවරුම් (C/A)**

බාහිර සහ ව්‍යාප්ති වැඩසටහන් හා පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා මාර්ගගතව ගෙවීමේ පහසුකම දිගටම ක්‍රියාත්මක කරන ලදී. UCSC හි මූල්‍ය පද්ධතිය උත්ශ්‍රේණි කළ අතර අවේක්ෂණය සහ තීර කේත (barecode system) පදනම් ප්‍රකාශ කිරීම් නිරීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

UCSC හි අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර වගුව 17 හි දැක් වේ. UCSC තුළ අනධ්‍යයන කාර්ය මණ්ඩලය 78ක සංඛ්‍යාවක් අනුමත කර තිබුණද ස්ථිර පත්වීම් 40 ක් පමණක් පුරවා ඇති අතර බොහෝ වැඩ කොන්ත්‍රාත් සහ පැවරුම් කාර්ය මණ්ඩලය මගින් සිදු කරනු ලබයි. UGC චක්‍රලේඛය මත පදනම්ව කොන්ත්‍රාත් සේවකයින් 22 දෙනෙක් ස්ථිර තනතුරු සඳහා සුදුසුකම් ලැබීය.

වගුව 17: අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| වර්ගය | ජ්‍යෙෂ්ඨකම(පරිපාලන) | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවකයන් | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|
| P | 8 | 4 | 22 | 6 | - |
| C | - | 6 | 11 | 8 | 17 |
| A | - | 1 | 10 | 9 | 7 |

## කාර්ය මණ්ඩල පුහුණුව සහ විදේශීය නිවාඩු

පුහුණු නිවාඩු: අධ්‍යයන කාර්ය මණ්ඩලයේ එක් සාමාජිකයෙක්, එනම් එස්.සී.එම්.බී. අත්තනායක (සිංගප්පූරුව) විදේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගී විය. අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් දොළොස් දෙනෙක් සංචාර 13ක් ඇතුළත් වූ විදේශ සම්මන්ත්‍රණවලට සහභාගී වූහ. නම් වශයෙන්: එම්ජීඑන්ඒඑස් ප්‍රනාන්දු (චීනය සහ තායිලන්තය), මහාචාර්ය එන්ඩී කොඩිකාර (සිංගප්පූරුව), කේ.කේ.කේ. ධර්මතිලක (තායිලන්තය), ඩබ්.එම්.කේ.ජී. වීරසිංහ (සිංගප්පූරුව), ආචාර්ය එච්.ඒ. කල්දේරා (මැලේසියාව), ආචාර්ය කේ.එල්. ජයරත්න (සිංගප්පූරුව), ආචාර්ය යමයා ඒකනායක (එ.රා.), ආචාර්ය ඒ.ආර්. වීරසිංහ (කටාර්), ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක (නවසීලන්තය), බඩී.වී. වෙල්ගම (ඉන්දියාව), ආචාර්ය ටී.එම්.එච්.ඒ. යූසුෆ් (හොංකොං) ආචාර්ය ඩීඒඑස් අතුකෝරළ (චීනය).

ශාස්ත්‍රඥයන් දෙදෙනෙකුට ප්‍රධාන කථිකයන් වශයෙන් ආරාධනා කරනු ලැබීය, නම් වශයෙන්: ආචාර්ය ඒ.ආර්. වීරසිංහ (ඉම්පාල්, ඉන්දියාව) සහ එම්.ඩී.එන්.ආර්. දයාරත්න (නවදිල්ලිය, ඉන්දියාව).

ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන යටතේ ස්වීඩනයේ පිහිටි උමියා විශ්වවිද්‍යාලයට සති හයක සංචාරයක නිරත විය. ආචා. එම්.ඩී.ආර්.එන්. දයාරත්න ඒකාබද්ධ ශාස්ත්‍රපති වැඩසටහන් පිළිබඳව සාකච්ඡාවකට ස්වීඩනයේ ස්ටොක්හෝම් විශ්වවිද්‍යාලයේ සංචාරයක නිරත විය. මහාචාර්ය ජීඑන් වික්‍රමනායක තායිවානයේ පැවති IOI තරඟාවලියට ජාතික කණ්ඩායම් නායකයා ලෙස සහභාගී විය. එමෙන්ම ඔහු APICTA 2014 තරඟාවලියේ විනිසුරුවරයෙක් ලෙස ඉන්දුනීසියාවේ ජකර්තා නුවර සංචාරය කළේය. ආචාර්ය කේ. එල් ජයරත්න මන්තන් සම්මානය ලබා ගැනීම පිණිස ඉන්දියාවේ සංචාරයක නිරත විය.

1වැනි ශ්‍රේණියේ ජොෂ්ඨ කථිකාචාර්යවරියක් වන ආචාර්ය ඒ.ටී. ධර්මරත්න මැලේසියාවේ පිහිටි මොනෑෂ් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා අධ්‍යයන නිවාඩු ලබා ගෙන ජනවාරි මාසයේ දී පිටත් විය. පසුව ඇය දෙසැම්බර් මාසයේ දී සේවයෙන් ඉල්ලා අස් විය. වසර තුළ දී අධ්‍යයන නිවාඩු ලබා ගත් දෙදෙනෙක් නැවත සිය රටට පැමිණි අතර ඔස්ට්‍රේලියාව බලා ගිය ආචාර්ය එ.ම්.සී. ජයවර්ධන මහතා ඉල්ලා අස් විය.

එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා වී.ඩී. විජේසූරිය 10-09-2014 සිට 01-11-2015 දක්වා අධ්‍යයන නිවාඩු ලබා ගත්තේය. තවත් තිදෙනෙක්, නම් වශයෙන් එච්.එම්. සිරිවර්ධන (ජපානය), එල්.එන්.සී. ද සිල්වා (ශ්‍රී ලංකාව), එම්.අයි.ඊ. වික්‍රමසිංහ (මැලේසියාව) අධ්‍යයන නිවාඩු දිගටම ලබා ගෙන ඇත. එෆ්.එච්.ඒ.එම්. ප්‍රේමචන්ද්‍ර (ඔස්ට්‍රේලියාව) ඇයගේ ආචාර්ය උපාධිය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව ආපසු පැමිණියාය.

කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් හතර දෙනෙක් පුද්ගලික සංචාර 06ක් සඳහා සහභාගී විය. නම් වශයෙන්: ඒ.එම්.ඩී.එච්. අත්තනායක (තායිලන්තය), කේ.එස්. ගුණතිලක (තායිලන්තය සහ මියන්මාරය), ආචාර්ය කේ.එල්. ජයරත්න (ඔස්ට්‍රේලියාව සහ ඉන්දියාව), එච්.කේ.ටී.සී. හල්ලොලුව (තායිලන්තය). පොත් තබන්නා, ජී.එම්. සිරිසේන කටාර් රාජ්‍යයේ රැකියාවක් සඳහා වසර දෙකක වැටුප් රහිත නිවාඩු ලබා ගත්තේය.

## කාර්ය මණ්ඩල සුභසාධනය

### රක්ෂණ යෝජනා ක්‍රමය

UCSC සේවකයින්ගේ ප්‍රතිලාභය පිණිස 2013 වසරේ දී යුනියන් ඇෂුවරන්ස් සමාගම සමඟ එක්ව රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර වසර මැද වන විට සේවකයින් 51දෙනෙක් පමණක් මෙම රක්ෂණ ක්‍රමයට දායක වී තිබිණි. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය සමඟ එක්ව සකස් කළ හිමිකම් පෑමේ ක්‍රමයක් මගින් මෙම යෝජනා ක්‍රමය ගෙවූ වාරිකය සිදු කළ හිමිකම්පෑම්වලට වඩා අඩු වූ බැවින් ප්‍රතිස්ථාපනය කරන ලදී.

**වාර්ෂික චාරිකාව**

UCSC කාර්ය මණ්ඩලය ඔක්තෝබර් මස 10–12 දිනවල ත්‍රිකුණාමලයේ චාරිකාවක නිතර විය. මෙයට අමතරව සුභසාධක සමිතිය විසින් ද දෙසැම්බර් මස 21වැනි දින අම්බලමේ දී එක් දින හමුවක් සංවිධානය කරන ලදී. සුභසාධක සමිතිය විසින් 2015 ජනවාරි 1වැනි දින සිට භාවිතා කිරීම පිණිස ශීතකරණයක්, මයික්‍රොවේව් උදුනක්, ව්‍යායාම උපකරණ ආදිය සහිත පහසුකම් හඳුන්වා දෙන ලදී. UCSC එහි උත්පාදන අරමුදල්වලින් ආසන්න වශයෙන් රු. මිලියන 5කින් පමණ සුභසාධක සමිති ක්‍රියාකාරකම් සඳහා දායක විය.

UCSC සුභසාධක රැස්වීම පෙබරවාරි මස 17වැනි දින පවත්වන ලද අතර සංඛ්‍යාන අධ්‍යයනාංශය සමිතියේ අරමුදල් වැඩි කිරීම සඳහා දායක වීමට අපොහොසත් වී ඇති බැවින් එම අධ්‍යයනාංශය සමිතියේ ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීම සඳහා වූ ඡන්දය 21වැනි දින පවත්වන ලදී.

# මූල්‍ය

## පුනරාවර්තන වියදම්

භාණ්ඩාගාර අරමුදල් උපාධි අපේක්ෂක ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් UCSC උත්පාදිත ආදායම එදිනෙදා මෙහෙයුම් සඳහා දායක කොට ගනී. උපාධි අපේක්ෂක ශිෂ්‍යයකු වෙනුවෙන් වියදම රු. 190,000 කි. UCSC විසින් උපාධි අපේක්ෂක පුනරාවර්තන වියදමින් 42%ක් වන රුපි. මිලියන 67කින් අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන සඳහා දායක විය. පුද්ගල වේතනවල වැඩිවීම හැරුණු කොට රජයේ වෙන් කිරීම පසුගිය වසරට වඩා අඩු විය. පුනරාවර්තන වියදම්වල බෙදා දැක්වීම 18 වගුවෙහි දක්වා ඇත.

වගුව 18: පුනරාවර්තන වියදම

රු. 000'

| විෂයය | 2013 | 2014 |
|---|---|---|
| පුද්ගල වේතන | 92,840 | 124,691 |
| ගමන් වියදම් | 528 | 645 |
| සැපයුම් | 4,579 | 8,969 |
| නඩත්තු | 3,057 | 5,303 |
| කොන්ත්‍රාත්තුමය සේවා | 29,701 | 37,614 |
| වෙනත් | 57,357 | 108,306 |
| එකතුව | **188,062** | **285,528** |

| | | |
|---|---|---|
| රජයේ ප්‍රතිපාදන | 91,802 | 93,716 |

## ප්‍රාග්ධන වියදම්

UCSC විසින් එහි පරිගණක පහසුකම් වැඩිදියුණු කිරීම උදෙසා එහි භෞතික සම්පත්වල ආයෝජනය කරන ලදී. පරිගණක විද්‍යාගාර කීපයක් සඳහාම උත්පාදිත අරමුදල් භාවිත කර නවීන උපකරණ ලබා දෙන ලදී. එමෙන්ම UCSC සිය ආයතනයේ වත්කම් සටහන් තබා ගැනීම සඳහා තීරු කේත ක්‍රමයක් ඇති කරන ලදී. ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයේ උපකරණ ඉහළ දියුණුවක් අත් කර ගැනීම පිණිස උසස් කරන ලදී. ප්‍රාග්ධන වියදම්වල විස්තර 19වැනි වගුවේ දක්වා ඇත.

වගුව 19: ප්‍රාග්ධන වියදම් රු. 000'

| විෂයය | 2013 | 2014 |
|---|---|---|
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ අත්පත් | 14,604 | 37,328 |
| යන්ත්‍රෝපකරණ අත්පත් කරගැනීම් | - | - |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත් කරගැනීම් | 22,327 | 71,702 |

| | | |
|---|---|---|
| වෙනත් | 4,076 | 6,506 |
| එකතුව | **41,007** | **115,536** |
| රජයේ ප්‍රතිපාදන | 19,150 | 15,000 |

**ව්‍යාපෘති (දේශීය/විදේශීය අරමුදල් සැපයූ)**

UCSC සතුව විෂයන් කිපයක ශක්තිමත් පර්යේෂණ කණ්ඩායමක් සිටී. ආදේශය සහ අනුකරණය (FASS-2, SLN), ඉ-ඉගෙනුම (NSF), තිරසාර පරිගණකකරණය (K-Sim, ASSERT, Tikiri DB), ආහාර ආරක්ෂාව (NTRP) සහ භාෂා තාක්ෂණය (LTRL) පරිශීලක ප්‍රජාව වෙත ළඟා වී ඇති විෂයන් අතර වේ. UCSC විසින් සහයෝගී අන්තර්-විෂයික පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කර ඇති අතර කර්මාන්ත විශ්වවිද්‍යාල සහයෝගීතාවද ශක්තිමත් කර ඇත.

පර්යේෂණ පාදක කරගත් ව්‍යාපෘතිවලට අමතරව UCSC රාජ්‍ය හා පෞද්ගලික අංශවලට උපදේශන සේවාද සපයයි. පෙරදී කරන ලද වැඩ පිළිබඳව UCSC හට මනා ප්‍රසිද්ධියක් ඇත. 1981 සිට ජාතික මැතිවරණවලට සහාය දක්වා ඇත. UCSC හි මෘදුකාංගයක් භාවිතයෙන් දැන් උපත්, විවාහ සහතික එසැණින් නිකුත් කරනු ලබයි. සිංහල යුනිකෝඩ් සැලසුම් කර හා දියුණු කිරීමේ UCSC උත්සාහයන් නිසා නවීන පරිගණක සිංහල භාෂාවට සහාය දක්වයි.

ඊ-ඉගෙනුම් කේන්ද්‍රය හරහා සංවිධාන රාශියක් සඳහා ඊ-පරීක්ෂණය පාදක බඳවා ගැනීමේ විභාග කිපයක්ම සිදු කරන ලදී. එමෙන්ම UCSC විසින් අධිකරණ නඩු කටයුතුවලට උපකාර වන ඩිජිටල් අපරාධ අධිකරණ විද්‍යා කටයුතු ද සිදු කරනු ලැබේ. නොවැම්බර් මස 11වන දින යුරෝපයේ ඩිජිටල් අපරාධ අධිකරණ විද්‍යාව හා කවුන්සිලයේ කණ්ඩායමක් ඩිජිටල් අපරාධ අධිකරණ විද්‍යාව සඳහා වූ මධ්‍යස්ථානයේ කටයුතු අධීක්ෂණය සඳහා සංචාරයක නිරත විය.

උනන්දුවක් දක්වන ප්‍රධාන පාර්ශ්ව සමග උපායමාර්ගික සම්බන්ධතා පවත්වා ගන්නා අතරම රටේ ඊ-රාජ්‍ය ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සහ රජයේ අමාත්‍යාංශ සහ HETC සමඟ නව ව්‍යාපෘති ආරම්භ කිරීම UCSC විසින් නොකඩවා කරගෙන යයි. තීක්ෂණ යනු, ශූන්‍ය ශේෂයකින් අරඹා දැන් රුපියල් මිලියන 9 ක් පමණ වන සංචිත ඇති UCSC හට අයත් සමාගමකි. UCSC විසින් සිදුකළ පර්යේෂණ ව්‍යාපෘතිවල විස්තර සහ ඒවයේ වියදම වගුව 20 සහ 21 හි ලැයිස්තුගත කර ඇත.

පශ්චාත් උපාධි මට්ටමේ ඒකාබද්ධ උපාධි වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස දෙසැම්බර් මස 15වැනි දින තාක්ෂණය පිළිබඳ කුවීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ කණ්ඩායමක් සමඟ හමුවක් පවත්වන ලදී.

**තීක්ෂණ**

තීක්ෂණ සඳහා දේශීය ප්‍රජාවගේ ආකර්ෂණය දිනා ගැනීමට හැකි වූ අතර 2013/14 මූල්‍ය වර්ෂය සඳහා ලාභයක් උපයා ගැනීමට ද හැකිවිය. තීක්ෂණ සඳහා විශාල අවධානයක් යොමු වූ අතර විශේෂයෙන්ම ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන් නිර්මාණය කරන ලද ස්වයංක්‍රිය ඇඟිලි සලකුණු හඳුනා ගැනීමේ පද්ධතියට (AFIS) හිමි වූ ප්‍රසිද්ධිය මෙයට හේතු විය. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම පද්ධතිය පෙබරවාරි මස 27වැනි දින දැයට කිරුළ ප්‍රදර්ශනයේ දී නිල වශයෙන් දියත් කරන ලදී. මෙම පද්ධතියේ සාර්ථකත්වය හේතුවෙන් අන්තර්ජාතික පොලිසියේ AFIS විශේෂඥ වැඩ කණ්ඩායම නොවැම්බර් මස 18-19වැනි දිනවල කොළඹ දී රැස් වූ අතර එහිදී UCSC විසින් නිර්මාණය කරන ලද ලද මෘදුකාංගය ඔවුන්ගේ මහත් ඇගයීමට ලක් විය.

තීක්ෂණ මගින් නිර්මාණය කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශිෂ්‍යයින් තෝරා ගැනීමේ පද්ධතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2013/14 අධ්‍යයන වර්ෂයේ සිට ඉතා සාර්ථකව භාවිත කරයි. මෙයට අමතරව, උප්පැන්න, විවාහ හා මරණ සහතික නිකුත් කිරීමේ පද්ධතියද සාර්ථකව භාවිතා කරන අතර එම ක්‍රමය 2013/14 වර්ෂයේ සිට වෙනත් දිස්ත්‍රික්කවලට ද ව්‍යාප්ත කරන ලදී. උසස් අධ්‍යාපනය සඳහා වූ පාදක සමීක්ෂණය පසු ගිය වසර මෙන්ම මෙම වසරේ දී ද කොළඹ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාන අධ්‍යයනාංශය සමඟ ඒකාබද්ධව ඉතා සාර්ථකව පවත්වන ලදී. නීතිඥයින්ට මාර්ගගතව මූලික අයිතිවාසිකම් නඩු ගොනු කිරීමේ

හැකියාව ලබා දෙන ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්‍යාධිකරණය සඳහා වූ ඊ-ගොනු කිරීමේ පද්ධතිය 2014 වසරේ දී ආරම්භ කරන ලද තවත් ප්‍රධාන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ද සම්පූර්ණ කරන ලද අතර ඔක්තෝබර් මස 30වැනි දින දියත් කරන ලදී. එමෙන්ම BITහි කළමනාකරණ තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම සඳහා මෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යාලයේ (UCSC) පශ්චාත්උපාධි ශිෂ්‍යයින් බඳවා ගැනීම සඳහා මාර්ගගතව අයදුම් කිරීම නිර්මාණය කිරීමටද තීක්ෂණ අඛණ්ඩව අනුග්‍රහය දක්වයි. තව ද UCSCහි මෘදුකාංග සංවර්ධන ඒකකයේ ව්‍යාපෘති කීපයකම නියමිත කාලය අත් කර ගැනීම පිණිස ද තීක්ෂණ කාර්ය මණ්ඩලය නොමිලේ සිය සහාය පළ කළේය.

තීක්ෂණ ආයතනය විධිමත් ලෙස පිහිටුවීමේ කටයුතු සම්බන්ධයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ උප-කුලපතිතුමා සමඟ සාකච්ඡා පවත්වන ලදී. පාලක සභාව පත්‍රයක් ද භාර දෙන ලදී. තීක්ෂණ ආයතනයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව UCSC අධ්‍යක්ෂ මණ්ඩලය හා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට පියවර ගන්නා ලද අතර 2013 වසරේ UCSC වාර්ෂික වාර්තාවට සමාගම පිළිබඳ සමාලෝචනයක් ඇතුළත් කිරීමට මෙන්ම ඒ පිළිබඳ තොරතුරු UCSC විගණකවරුන් වෙත ලබාදීමට ද කටයුතු කරන ලදී. UCSCහි කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 62දෙනෙක් තීක්ෂණ සාමාජිකත්වය ලබා ගැනීම තුළින් සහ එහි කටයුතු සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වීම තුළින් තීක්ෂණ ආයතනයේ වැදගත්කම වසර තුළ දී තවදුරටත් වැඩි විය. තීක්ෂණ සාමාජිකයින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන අතර මේ සඳහා වැඩි පිරිසකට සම්බන්ධ වීමට ඉඩප්‍රස්ථා ඇත. සෑම රැස්වීමක් සඳහාම අධ්‍යක්ෂවරුන්ගේ 70%කට වැඩි සහභාගීත්වය තුළින් ඔවුන්ගේ පැමිණීමේ දිරිමත් භාවය ප්‍රදර්ශනය විය. තීක්ෂණ සිය මුල් ඉලක්කයක් වූ එහි සංචිත මිලියන 10කට වැඩි අගයක් දක්වා ගෙන යාමටත් මිලියන 9ක් ආයෝජනය කිරීමටත් සමත් විය. 2013 වසරේ ජනවාරි මස 31වැනි දින සහ 2014 වසරේ සැප්තැම්බර් මස 26වැනි දින තීක්ෂණ ආයතනයේ වාර්ෂික සභා රැස්වීම් පවත්වන ලදී.

## ප්‍රදර්ශන

වැඩසටහන් සහ යම් ශිෂ්‍ය ව්‍යාපෘති කීපයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ඔක්තෝබර් මස 24 සිට 26 දක්වා පැවති Infotel ප්‍රදර්ශනය සඳහා UCSC සහභාගී විය.

වගුව 20: පුනරාවර්තන වියදම

රු. 000'

| නම සහ විස්තර | ප්‍රදානය | අරමුදල්කරණ නියෝජිතායතනය | TCE | RFA | DF |
|---|---|---|---|---|---|
| Tikiri DB | 1,558 | පරිගණක විද්‍යාව පිළිබඳ ස්වීඩන | | | |
| Summer School ව්‍යාපෘතිය | 2,777 | ස්ටොක්හෝම් විශ්වවිද්‍යාලය | | | |
| ASSERT | 2,087 | උප්සලා විශ්වවිද්‍යාලය | | | |
| **විදේශීය අරමුදල්** | **6,422** | | | | |
| යුධ බිම් කාලතුවක්කු අනුකාරක පද්ධතිය | 2,428 | ආරක්ෂක අමාත්‍යාංශය | | | |
| ත්‍රිමාන වෙරළ ආවේක්ෂණ පද්ධතිය | 2,655 | ජාතික විද්‍යා පදනම | | | |
| අස්වැන්න නිෂ්පාදනය නිරීක්ෂණය සහ කළමනාකරණය | 6,008 | ජාතික විද්‍යා පදනම | | | |
| විවිධ ඉගෙනුම් ප්‍රජා තුළ mLearing | 1,020 | ජාතික විද්‍යා පදනම | | | |
| Face ID-ත්‍රිමාන චිත්‍රක භාවිතයෙන් ශ්‍රී ලංකාව සඳහා අධිකරණ වෛද්‍ය විද්‍යාත්මක මුහුණු ප්‍රතිසංස්කරණය | 1,569 | ජාතික විද්‍යා පදනම | | | |
| ගුවන් යානා පුහුණු අනුකාරක ව්‍යාපෘතිය | 1,008 | ආරක්ෂක අමාත්‍යාංශය | | | |
| ස්වයංකෘත අන්තර්ගතය පදනම් ස්වයං නිරීක්ෂණ පද්ධතිය | 800 | උසස් අධ්‍යයන සඳහා ජාතික මධ්‍යස්ථානය | | | |
| **දේශීය අරමුදල්** | **20,226** | | | | |

TCE – ඇස්තමේන්තුගත මුළු පිරිවැය; RFA – අයදුම් සඳහා ඉල්ලීම; DF – වට්ටම් සාධකය

## ව්‍යාපෘති වියදම (දේශීය/විදේශීය අරමුදල් සැපයූ)

වගුව 21: ව්‍යාපෘති වියදම

Rs. 000'

| නම | TCE ඉ/ගෙ නිවැරදි පිරිවැය | 2013 දී වියදම | 2014 දී වියදම | 2014.12.31 දිනට සමුච්චිත වියදම | භෞතික ප්‍රගතියේ % |
|---|---|---|---|---|---|
| Tikiri DB | | 120 | 465 | 585 | 99% |
| Summer School ව්‍යාපෘතිය | | | 2345 | 2345 | 100% |
| ASSERT | | | 656 | 656 | 25% |
| **විදේශීය අරමුදල්** | | **120** | **3,466** | **3,586** | |
| යුධ බිම් කාලතුවක්කු අනුකාරක පද්ධතිය | 1010 | 458 | 515 | 1983 | 95% |
| ත්‍රිමාන වෙරළ ආවේක්ෂණ පද්ධතිය | 1709 | 607 | 273 | 2589 | 100% |
| අස්වැන්න නිෂ්පාදනය නිරීක්ෂණය සහ කළමනාකරණය | | 1666 | 1786 | 3452 | 50% |
| විවිධ ඉගෙනුම් ප්‍රජා තුළ mLearing | | | 309 | 309 | 100% |
| Face ID-ත්‍රිමාන චිත්‍රක භාවිතයෙන් ශ්‍රී ලංකාව සඳහා අධිකරණ වෛද්‍ය | | | 426 | 426 | 50% |
| ගුවන් යානා පුහුණු අනුකාරක ව්‍යාපෘතිය | | | 836 | 836 | 90% |
| ස්වයංකෘත අන්තර්ගතය පදනම් ස්වයං නිරීක්ෂණ පද්ධතිය | | | 335 | 335 | 100% |
| **දේශීය ව්‍යාපෘති වියදම** | **2,719** | **4,515** | **6,220** | **13,454** | |

## මූල්‍ය ප්‍රගතිය (වියදම්)

වගුව 22: මූල්‍ය ප්‍රගතිය (වියදම්) රු. 000'

| විෂයය | ප්‍රතිපාදනය | වියදම | ඉතුරුම්/අතිරික්තය |
|---|---|---|---|
| ව්‍යාපෘති හැර පුනරාවර්තන | 269,025 | 285,528 | (16,503) |
| ව්‍යාපෘති හැර ප්‍රාග්ධන | 199,450 | 132,206 | 67,244 |
| ව්‍යාපෘති - දේශීය අරමුදල් | 13,454 | 13,454 | 0 |
| ව්‍යාපෘති – විදේශීය අරමුදල් | 8,920 | 8,920 | 0 |
| එකතුව | **490,8490** | **440,108** | **50,741** |

## මූල්‍ය ප්‍රගතිය (උපයාගත් ආදායම)

වගුව 23: මූල්‍ය ප්‍රගතිය (උපයාගත් ආදායම්) රු. 000'

| ආදායම් මූලාශ්‍රය | ප්‍රතිපාදනය | රැස් කිරීම | ඌනතාවය / අතිරික්තය |
|---|---|---|---|
| උපාධි අපේක්ෂක අධ්‍යයන | 2,775 | 4,366 | 1,591 |
| පශ්චාත් උපාධි අධ්‍යයන | 63,103 | 66,469 | (3,366) |
| උපදේශන | 11,500 | 18,589 | 7,089 |
| බාහිර උපාධි | 88,915 | 72,620 | (16,295) |
| වෙනත් | 53,254 | 75,426 | 22,172 |
| එකතුව | **272,801** | **237,470** | **11,191** |

උපාධි අපේක්ෂකයන්ගේ ආදායම හැර UCSC විසින් 2728015ක උත්පාදිත ආදායමක් උපයන ලදී. UCSC හි උත්පාදනය කළ ආදායම එහි ප්‍රධාන විශ්වවිද්‍යාලය ඇතුළු බොහෝ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට වඩා ඉතා ඉහළ විය.

## මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

වගුව 24: මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

රු. 000'

| විෂයය | ගණනය කළ ආකාරය | එක් ශිෂ්‍යයෙක් සඳහා වියදම |
|---|---|---|
| එක් ශිෂ්‍යයෙක් සඳහා පුනරාවර්තන වියදම (RE) | RE / ශිෂ්‍ය බලයේ සංඛ්‍යාව | 189 |
| ශිෂ්‍යයෙක් සඳහා ප්‍රාග්ධන වියදම (CE) | CE / ශිෂ්‍ය බලයේ සංඛ්‍යාව | 156 |
| එකතුව | | **345** |

## 2014 වර්ෂයේ යටිතල පහසුකම්

සීමිත ඉඩක ක්‍රියා කරන UCSC සඳහා දේශන පැවැත්වීමටද ප්‍රමාණවත් ඉඩක් නැත. ශිෂ්‍යයන් සඳහා ප්‍රමාණවත් ඉඩක් ආපන ශාලාව, පොදු සහ ඉගෙනුම් කාමර තුළ නැත. විශ්වවිද්‍යාලයට බිමක් ලබා දීමට නොහැකි බැවින් UCSC බටහිර අංගනය සහ හතරවන මහල ව්‍යාප්ත කොට ගොඩනැගීම ආරම්භ කළේ උපාධි අපේක්ෂකයින්ගේ පන්ති කාමරවල අඩුව සම්පූර්ණ කිරීමට සහ පූර්ණ කාලීන පර්යේෂණ සිසුන්ගේ නවාතැන් සඳහා වන අතර එය 2013 වන විට අවසන් කරන ලදී.

කෙටිකාලීන යටිතල පහසුකම්වල අවශ්‍යතාවයට මුහුණ දෙන අතර පුළුල් කිරීමේ සැලසුම් මධ්‍ය හා දිගු කාලීන අරමුණුවලට මුහුණ දෙන අයුරින් සැලසුම් කරන ලදී. දැනට ආපන ශාලාව පවතින ස්ථානයේ ආපන ශාලාවක් හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදි කිරීම සමගින් දේශන ශාලා/අධ්‍යයන කාමර මගින් දැනට පවතින ශ්‍රවණාගාරය ප්‍රතිස්ථාපනය කිරීම මධ්‍යකාලීන අරමුණු අතර වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස පුවත්පත් දැන්වීමක් පළ කරන ලද අතර සුදුසු ස්ථාන කීපයක් හඳුනා ගැනීම ද සිදු කරන ලදී. කෙසේ වුවද උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම යෝජනා කිසිවක් අනුමත නොකළ අතර එබැවින් ඉඩමක් මිල දී ගැනීමේ ව්‍යායාමය අසාර්ථක විය. ගොඩනැගිලි වැඩකටයුතු පිළිබඳ විස්තර 25වැනි වගුවේ දැක්වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් UCSC 2015 වසරේ සිට ශිෂ්‍යයින් 350 දෙනෙක් බඳවා ගැනීමේ කොන්දේසිය මත ආපන ශාලාවේ සහ පරිපාලන ගොඩනැගිල්ලේ 2වැනි අදියර අනුමත කරන ලදී. කෙසේ වුවද, වර්තමානයේ පවතින සීමිත ඉඩකඩ පිළිබඳව පැහැදිලි කිරීමෙන් පසුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් UCSCහි ආපනශාලාවේ සහ පරිපාලන ගොඩනැගිල්ලේ 2වැනි අදියර ඉදි කිරීම අනුමත කරන ලදී. නැගෙනහිර පැත්තේ ඉහළම මහල සැප්තැම්බර් මස 12වැනි දින භාර දුන් අතර UCSC ආපනශාලාවේ 1වැනි අදියර සහ ඉහළම මහල උපකුලපතිතුමා සහ අනෙක් ආරාධිතයින්ගේ සහභාගීත්වයෙන් UCSCහි ශ්‍රවණාගාරයේ අත්තිවාරම සමගින් ඔක්තෝබර් මස 30වැනි දින විවෘත කරන ලදී.

වගුව 25: යටිතල පහසුකම්

රු. 000'

| යටිතල පහසුකම් විස්තර | වියදම (රු) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| අපන ශාලාව සහ පරිපාලන ගොඩනැගිලි කොටස | 49,318 | 100% |
| UCSC ශ්‍රවණාගාරය සහ දේශන ශාලා | 26,500 | 30% |

### මෙම වාර්තාව හා සම්බන්ධ වෙනත් විස්තර

දේශීය හා අන්තර්ජාතික වශයෙන් දෘශ්‍යතාව වැඩිදියුණු කිරීම පිණිස UCSC වෙබ් අඩවිය සහ සමාජ ජාල හරහා UCSC ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීම පුළුල් කරන ලදී.

තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය හා නිෂ්පාදන සමාජය තුළ ඉතා පුළුල් ලෙස ව්‍යාප්ත කරවීම UCSCහි ප්‍රධාන සමාජ වගකීමක් ලෙස සලකනු ලැබේ. UCSC ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වැඩසටහනකින් සෑම බදාදා දිනකම උදෑසන 9 සිට 10 දක්වා ප්‍රචාරය කරනු ලබන ප්‍රජා අතුරු මුහුණතක් හරහා මෙම කාර්යය ඉටු කරයි. එමෙන්ම UCSC තොරතුරු තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික ඔලිම්පියාඩ් (IOI) තරඟය ඇතුළු මෘදුකාංග තරඟ

පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට සහ පාසැල්වලට සහාය දෙයි. ජුලි මස 13-20 දක්වා තායිවානයේ පැවති IOI14 තරඟයට සහභාගී වූ සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත IOI කණ්ඩායමට NSF සහ 7StepsGlobe යන සමාගම් සමඟ UCSC ද අනුග්‍රාහකත්වය දක්වන ලදී. මෙම කණ්ඩායම මැයි මස 11වැනි දින පැවති ආසියානු පැසිපික් තොරතුරු තාක්ෂණ ඔලිම්පියාඩ් (APIO) තරඟය සඳහාද තරඟ වැදිණි.

UCSC ආදි ශිෂ්‍ය සංගමය නැවත සක්‍රිය කිරීම පිණිස UCSC ආදි ශිෂ්‍ය සංගමයේ රැස්වීමක් පවත්වන ලදී. UCSC Vmware vCloud suite මඟින් සවිබල ගැන් වූ මෘදුකාංග නිශ්චිත දත්ත මධ්‍යස්ථානයක් හිමි එකම රාජ්‍ය ආයතනය මෙන්ම එකම අධ්‍යාපන ආයතනය ද වේ. 2012 පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව සඳහා සහ 2012 UCSC වාර්ෂික වාර්තාව සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සමාලෝචනය කරන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යනායතනය

කොළඹ විශ්වවිද්‍යාලය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ආදායම් සහ වියදම් ගිණුම

| | 2014 | 2013 |
|---|---|---|
| උපාධි අපේක්ෂක වැඩසටහන | රු | රු |
| ආදායම | | |
| රාජ්‍ය ප්‍රදාන | 93,716,000 | 90,383,000 |
| විලම්බිත ආදායම් - ප්‍රදාන | 15,261,355 | 14,430,010 |
| වෙනත් | 4,367,219 | 3,610,684 |
| | 113,344,574 | 108,423,694 |
| උපාධි අපේක්ෂක වැඩසටහන - වියදම් | | |
| පුද්ගල වේතන | 89,779,332 | 69,371,031 |
| ගමන් වියදම් | 161,441 | 623,097 |
| සැපයුම් | 8,057,216 | 4,573,837 |
| කොන්ත්‍රාත්තුමය සේවා | 37,313,552 | 33,428,209 |
| විශ්‍රාම ප්‍රතිලාභ | 15,252,053 | 16,183,766 |
| දායකත්වය, දායක. සහ සාමාජිකත්ව ගාස්තුව | 108,890 | 105,530 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 211,000 | 19,000 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 10,577,455 | 9,005,017 |
| ක්ෂය | 21,418,266 | 16,818,989 |
| එකතුව | 182,879,205 | 150,128,476 |
| උපාධි අපේක්ෂක වැඩසටහනෙන් හිඟය | (69,534,631) | (41,704,782) |
| ව්‍යාප්ති වැඩසටහන | | |
| විද්‍යාපති වැඩසටහන | 47,256,202 | 44,871,205 |
| බාහිර උපාධි මධ්‍යස්ථානය | 37,012,897 | 54,004,151 |
| පරිගණක සේවා මධ්‍යස්ථානය | 2,255,363 | 4,748,974 |
| උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය | 788,354 | 1,054,794 |
| ඊ-ඉගෙනුම් මධ්‍යස්ථානය | 11,285,752 | 10,384,270 |
| වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය | (289,738) | (416,751) |
| ව්‍යාප්ති වැඩසහනෙන් අතිරික්තය | 98,308,830 | 114,646,643 |
| ව්‍යාපෘති | | |
| විදේශ අරමුදල් සැපයූ පොදු ව්‍යාපෘති | 35,302 | - |
| ICTer සම්මන්ත්‍රණය - 2012 | 1,110,876 | 1,624,264 |
| IDRC අතථ්‍ය ගම්මානය | 199,944 | - 65,175 |
| ව්‍යාපෘතිවලින් අතිරික්තය | 1,346,122 | 1,559,089 |
| තීක්ෂණ | 867,901 | 644,080 |
| ශුද්ධ අතිරික්තය/(හිඟය) | 30,988,222 | 75,145,030 |

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යනායතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2014 රු | 2013 රු |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| වර්ෂය සඳහා හිඟය/අතිරික්තය | 30,988,222 | 75,145,030 |
| ගැළපුම් | | |
| ක්ෂය - | 32,924,670 | 29,786,429 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 3,686,567 | 4,693,425 |
| විලම්බිත ආදායම් | (19,585,628) | (18,973,278) |
| ලැබුණු පෙර ප්‍රදානවලින් මාරුකිරීම් | (10,048,003) | (5,689,864) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභය | (190,806) | (358,575) |
| විනිමය ආදායම | (408,592) | (521,282) |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය | 37,366,430 | 84,081,885 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් | (11,886,227) | 16,344,815 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඉපැයූ ශුද්ධ මුදල් | 25,480,203 | 100,426,700 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | (35,722,193) | (36,329,243) |
| යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම් | (89,612,748) | (33,513,991) |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබූ මුදල් | 196,600 | 365,000 |
| දේපළ, පිරියත සහ උපකරණ පුනරුත්ථාපන සහ නඩත්තු | (6,133,904) | (3,775,562) |
| | (105,792,042) | 27,172,904 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ | | |
| ලද ප්‍රාග්ධන ප්‍රදාන - රජයෙන් | 15,000,000 | 25,759,000 |
| ලද ප්‍රාග්ධන ප්‍රදාන - උත්පාදිත අරමුදල් | 41,343,330 | 673,230 |
| ලද ව්‍යාපෘති ප්‍රදාන | 16,271,736 | 7,105,427 |
| පෙර වසරේ ගැළපීම | 2,000 | - |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති ශේෂවලින් මාරු කිරීම | 1,068,757 | (1,790,632) |
| ගෙවූ පාරිතෝෂික | (1,150,778) | (934,588) |
| මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 35,380,673 | 11,978,456 |
| විනිමය ආදායම/(අලාභය) | 2,123,676 | 69,963,797 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 408,592 | 521,282 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 651,587,603 | 581,102,523 |
| | 654,119,872 | 651,587,603 |

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යනායතනය

මූල්‍ය සාරාංශය

| | රු. '000 | | | | |
|---|---|---|---|---|---|
| මූල්‍ය වර්ෂය | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
| රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන | 93,716 | 90,383 | 91,802 | 83,102 | 65,381 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 15,000 | 25,759 | 19,150 | 16,000 | 4,920 |
| මුළු ලද රජයේ ප්‍රදාන | 108,716 | 116,142 | 110,952 | 99,102 | 70,301 |
| පුනරාවර්තන වියදම් (විශ්වවිද්‍යාල වැඩසටහන) | 160,901 | 133,190 | 111,212 | 92,310 | 80,120 |
| ප්‍රාග්ධන වියදම් | 132,206 | 71,371 | 31,178 | 28,628 | 21,301 |
| මුළු වියදම (විශ්වවිද්‍යාල වැඩසටහන) | 293,107 | 204,561 | 142,390 | 120,938 | 101,421 |
| උත්පාදිත ආදායමෙන් දායකත්වය | 184,391 | 88,419 | 31,438 | 21,836 | 31,120 |
| උත්පාදිත දළ ආදායමෙන් දායකත්වය -% | 78% | 37% | 16% | 14% | 25% |
| උත්පාදිත ශුද්ධ ආදායමෙන් දායකත්වය -% | 163% | 63% | 28% | 28% | 62% |
| උත්පාදිත ආදායම | 247,470 | 242,025 | 194,230 | 159,429 | 123,267 |
| පුනරාවර්තන වියදම් ව්‍යාප්ති වැඩසටහන් | 124,627 | 102,173 | 82,390 | 80,197 | 73,313 |
| විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘති සඳහා ලද ප්‍රදාන | 9,713 | 9,341 | 5,639 | 6,202 | 93,581 |
| අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව | 850 | 879 | 737 | 737 | 739 |
| සේවක සංඛ්‍යාව | 179 | 144 | 144 | 144 | 151 |
| වර්ෂයකට ශිෂ්‍යයකුට පුනරාවර්තන පිරිවැය ('000) | 190 | 152 | 151 | 125 | 108 |
| වර්ෂයකට ශිෂ්‍යයකුට ප්‍රාග්ධන පිරිවැය ('000) | 156 | 81 | 42 | 39 | 29 |
| වර්ෂයකට සේවකයෙකුට පිරිවැය ('000) | 795 | 774 | 670 | 578 | 457 |

කොළඹ විශ්වවිද්‍යාලය

2014 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| වත්කම් | 2014<br>රු<br>N.B.V | 2013<br>රු<br>N.B.V |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ, පිරියත සහ උපකරණ | | |
| ගොඩනැගිලි | 138,479,074 | 71,371,639 |
| විද්‍යාගාර සහ තාක්ෂණික උපකරණ ගෘහභාණ්ඩ සහ සවිකිරීම | 87,801,965 | 74,846,459 |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 1,008,686 | 973,843 |
| මෝටර් වාහන | 3,692,684 | 4,933,664 |
| එකතුව | 230,982,409 | 152,125,605 |
| ප්‍රාග්ධන වත්කම්වල පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම | 34,451,933 | 31,404,754 |
| නොනිමි ඉදි කිරීම් වැඩ | 26,500,920 | 9,775,667 |
| ජංගම වත්කම් | | |
| තොග | 2,755,377 | 3,198,314 |
| ලැබිය යුතු දෑ සහ කලින් ගෙවීම් | 68,937,373 | 88,669,647 |
| SIDA අරමුදල් | | - |
| මුදල් සහ මුදල් සමාන දෑ | 654,119,872 | 651,587,603 |
| මුළු ජංගම වත්කම් | 725,812,622 | 743,455,564 |
| මුළු වත්කම් | 1,017,747,900 | 936,761,599 |

| හිමිකම් සහ වගකීම් | | |
|---|---|---|
| ප්‍රාග්ධනය සහ සංචිත | | |
| ප්‍රාග්ධනය | | |
| වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 11,708,963 | 19,451,866 |
| වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | 235,503,117 | 113,563,832 |
| විදේශීය අරමුදල් සැපයූ ව්‍යාපෘති-වැය නොකළ | 9,096,416 | 2,720,033 |
| විදේශීය අරමුදල් සැපයූ අරමුදල්-වැය කළ | 12,517,918 | 21,334,025 |
| විලම්බිත ප්‍රදාන | | |
| UoC වෙතින් දායකත්වය | 8,155,714 | 8,155,714 |
| එකතුව | 276,982,128 | 165,225,470 |
| සංචිත | 403,940,980 | 464,395,995 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 3,000,000 | 3,000,000 |
| සීමා කළ අරමුදල් | 128,472,862 | 70,067,477 |
| ජංගම නොවන වගකීම් | | |
| විශ්‍රාම ප්‍රතිලාභ | 34,251,258 | 31,395,771 |
| ජංගම වගකීම් | | |
| වෙනත් උපචිත වියදම් සහ ගෙවිය යුතු දෑ | 171,100,672 | 202,676,886 |
| බැංකු අයිරාව | - | - |
| එකතුව | 171,100,672 | 202,676,886 |
| මුළු හිමිකම් සහ වගකීම් | 1,017,747,900 | 936,761,599 |

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කර ඇත.

........................ අධ්‍යක්ෂ (UCSC)
27.06.2016

........................ නියෝජ්‍ය අධ්‍යක්ෂ

........................ නියෝජ්‍ය මූල්‍යාධිකාරී

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : ඊසී/සී/යූසීඑස්සී/1/14/එල්ජ්

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2015 නොවැම්බර් 12 දින

UNIVERSITY OF COLOMBO, SCHOOL OF COMPUTING
17 NOV 2015
DIRECTOR'S OFFICE

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මෙ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් :-

1. ලේකම් , මුදල් අමාත්‍යාංශය
2. ලේකම් , විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
3. සභාපති , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති , කොළඹ විශ්වවිද්‍යාලය



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ඊසී/සී/යූසීඑස්සී/1/14/එෆ්ජ්    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2015 නොවැම්බර් 12 දින

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය සඳහා සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදනම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.1,235,809 ක්වූ වත්කම් තවදුරටත් ආයතනය ප්‍රයෝජනයට ගනිමින් පැවතුනද ඒහි සඳහන් අගය පෙන්නුම් කෙරෙන පරිදි ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව රු.50,077 ක් වූ උපචිත වියදම් ගිණුම් වලින් අත් හැරී තිබුණි.

(ආ) පශ්චාත් උපාධි පාඨමාලා සඳහා 2015/ 2016 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබුනු මුළු පාඨමාලා ගාස්තුව රු.51,060,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ලැබූ පාඨමාලා ගාස්තු ලෙස රු.51,082,500 ක් දක්වා තිබීමෙන් ජංගම වගකීම් රු.17,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

2.2.3 නොසැසඳුණු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව බාහිර විභාග මධ්‍යස්ථාන (EDC) විසින් පවත්වනු ලබන Bachelor of Information Technology (BIT) පාඨමාලාවේ ආදායම හා බාහිර විභාග මධ්‍යස්ථානය විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු වල සඳහන් එම ආදායම සමඟ සැසඳීමේදී රු. 1,867,934 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් උපයනලද සියළුම ආදායම් ආයතන අරමුදලේ කොටසක් වියයුතු අතර 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව මූල්‍ය කමිටු අනුමැතිය මත ආයතනය විසින් වෛද්‍ය රක්ෂණ අරමුදලක් ඇතිකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,739,294 ක ශේෂයක් පැවතුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යය අවසන් කර තිබුණු විදේශ ව්‍යාපෘති 05ක පැවති රු.11,559,430 ක අරමුදල් ශේෂ වසර 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු නොකර ගෙවියයුතු ගිණුම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට විවිධ හේතූන් නිසා සේවය අවසන් කර තිබූ ආයතනයේ නිලධාරීන්ගෙන් හා සේවකයින් 7 දෙනෙකුගෙන් ආයතනයට අය විය යුතු රු.234,874 ක ණය ශේෂයක් වසර 5 කට වැඩි කාලයක් අය නොවී පැවතුණු අතර මෙම මුදල් සේවක අර්ථ සාධක අරමුදලින් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනය මගින් මෙහෙයවනු ලබන තොරතුරු ආරක්ෂාව පිළිබඳ විද්‍යාපති (Master of Science in Information Security (MSC in IS) පාඨමාලාවේ 2013 වර්ෂයට පෙර ලැබිය යුතුව තිබූ රු.30,000 ක මුදලක් 2015 අගෝස්තු 31 වනවිටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් ලබා දීමේදී අදාළ කාර්යය සඳහා ඇස්තමේන්තු අනුව ප්‍රමාණවත් මුදලක් ලබාදිය යුතු වුවත් අවස්ථා 18 කදී නිලධාරීන් 8 දෙනෙකු සඳහා රු.230,245 ක් වූ අත්තිකාරම් වැඩිපුර ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය. |
| (ආ) | 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 3 (ඇ)(ඇ) වගන්ති | ආයතනය විසින් ආරම්භ කරනු ලබන උපාධි සහ අනෙකුත් පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත් ආයතනය විසින් පවත්වාගෙන යන පාඨමාලා 06 ට අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

(ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අරමුදල් පිහිටුවීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.9,960,290 ක් වූ අරමුදල් ගිණුම් හතරකට අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.30,988,222ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.75,145,030 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.44,156,808 ක් අඩුවීම සඳහා සේවක පරිපාලන වියදම් රු.20,408,301 කින් සහ ගිවිසුම්ගත සේවා වියදම රු.3,885,343 කින් වැඩිවීමද වැඩසටහන් ආදායම රු.16,337,813 කින් අඩුවීමද ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය ආයතනය සමග අත්සන් කර තිබූ ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,011,710 ක් අය වියයුතු අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආචාර්යවරයෙකුගෙන් අයවිය යුතු වූ රු. 3,440,575 ක ගිවිසුම් බැඳුම්කර වටිනාකම් අදාල ආචාර්යවරයා පිළිබඳ තොරතුරු සොයාගැනීමට නොහැකි වීම හේතුවෙන් අයකර ගැනීම අවිනිශ්චිත වූ අතර එය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය

ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආයතනය වෙත ලබා දී තිබූ රු.3,103,213 ක මුදලක් වසර තුනකට වැඩි කාලයක සිට වැය නොකර ගිණුම්වල රඳවාගෙන තිබූ අතර එකී අරමුදල් ඵලදායී ලෙස යොදවා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කර නොතිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් වත්කම් අත්පත් කර ගැනීමේ අරමුණින් යුතුව පිහිටුවා තිබූ අරමුදල් දෙකක එකතුව රු.4,843,802 ක ශේෂයන් පැවති අතර සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් මිලදී ගැනීම සඳහා මෙම අරමුදල් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුදලේ ලැබීම් ඉක්මවා වියදම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 6,137,408 ක ඍණ ශේෂයක් නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් පාලනය

(ආ) ගිවිසුම් හා බැඳුම්කර

(ඇ) මූල්‍ය පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

2015 දෙසැම්බර් මස 16 දින

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර
බත්තරමුල්ල

මහත්මයාණෙනි

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

ඔබගේ ඉහත වාර්තාව 2015-12-16 දින පැවැති කොළඹ විශ්ව විද්‍යාලිය පරිගණක අධ්‍යන ආයතනයේ 48 වන විගණන කමිටුවේදි සාකච්ඡා කල අතර එකී වාර්තාව සඳහා අපගේ පිළිතුරු පහත දැක්වේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්වාගණනය කළ මතය

සටහන් කර ගතිමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්විම.

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිනුම්කරන ප්‍රමිති.

IDRC ව්‍යාපෘතියේ සියලු මූල්‍ය කටයුතු 2008 වර්ෂයේ ව්‍යාපෘතියේ මෙහෙයුම් කාර්යය අවසන් වීමත් සමග අවසානයට පත්විය.

විමසුමේ සඳහන් වත්කම් 2005 දී මිලදීගත් ඉලෙක්ට්‍රෝනික උපකරන, ලැප්ටොප් හා ඩෙස්ක්ටොප් පරිගණක වේ.මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිනුම්වල ගැලපීමට කටයුතු කරමි.

2.2.2 ගිනුම්කරණ අඩුපාඩු

(අ) අදාල නිවැරදි කිරිම් සිදුකර ඇත.

(ආ) ඉදිරියට ලැබු පාඨමාලා ගාස්තුව අඩුවෙන් නොව වැඩියෙන් දක්වා ඇත. අදාල රු. 17,500.00 ඉදිරියට ලැබු පාඨමාලා ගාස්තුව පුස්තකාල තැන්පතු වේ.

2.2.3 නොසැදුන පාලක ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල සඳහන් BIT පාඨමාලා ආදායම භාහිර විභාග මධ්‍යස්ථානයෙන් ලබාදුන් ආදායමට වඩා රු 1,867,934.00 ක් වැඩි වුවද එය අප වෙත මුදලින් ලැබු නිවැරදි අගය වේ. නමුත් භාහිර උපාධි මධ්‍යස්ථානය අදාල තොරතුරු යාවත්කාලින කරනුයේ අදාල සිසුන් ගෙවිම් වවුචරය එම අංශය වෙත ගෙන විත් භාරදුන් පසුව නිසාය.

2.3 ප්‍රමානවත් අධිකාරි බලයකින් තහවුරු නොවු ගනුදෙනු

ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය සඳහා අවශ්‍ය අරමුදල් සාමාජිකයන්ගෙන් 40% සහ ආයතනයෙන් 60% ක් වශයෙන් ලබාගෙන ඇත. ආයතනයෙන් ලැබෙන 60% ක ප්‍රමාණය කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගනක අධ්‍යන ආයතනය මගින් පවත්වන බාහිර උපාධි පාඨමාලාව සහ පශ්චාත් උපාධි පාඨමාලාවලින් උපයන අරමුදල් වලින් අදාල පාඨමාලාවල අයවැය මගින් වෙන්කරන මුදල්වලින් සම්පාදනය කරනු ලබයි. මෙම වෛද්‍ය රක්ෂණ ක්‍රමය වාර්ෂිකව ආයතනයේ මූල්‍ය කමිටුවේ නිර්දේශය සහ කළමණාකරන මණ්ඩලයේ අනුමැතියෙන් පවත්වාගෙන යන ලබයි.

(ඈ) **<u>I) Equipment Replacement Fund Rs 3,252,477.00</u>**

මෙම අරමුදල 2015 ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනිම සඳහා යොදවා ඇත.

II) **<u>Staff Development Fund Rs.180,629.00</u>**

මෙම අරමුදල කාර්යය මණ්ඩල පුහුණු සේවක සඳහා යෙදවීමට කටයුතු කරමි.

III) **<u>Hardware 2 software fund Rs 1,891,325.00</u>**

මෙම අරමුදල 2015 ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනිම සඳහා යොදවා ඇත.

IV) **<u>BIT Development fund Rs.3,315,859.00</u>**

මෙම අරමුදල සඳහා අදාල අනුමැතිය ලබා ගැනිමට කටයුතු කරමි.

2.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) <u>CDF Lab Project - රු 2,336,374.00</u>

ඉහත ව්‍යාපෘති ශේෂය ආයතනයේ Projects අංශය යටතේ පැවැති අතර 2015 වසර තුළ ඉහත ශේෂය භාවිතා කර ඇත.

II) **<u>e -Health Project Rs 3,695,641.00</u>**

ඉහත ව්‍යාපෘති ශේෂය ආයතනයේ CSC අංශයේ පැවති අතර 2015 වර්ෂය ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනිම සඳහා භාවිතා කර ඇත.

III) **<u>IDRC Project Rs 1,076,325.00</u>**

ඉහත ව්‍යාපෘති ශේෂය ආයතනයේ CSC අංශයේ පැවති අතර 2015 වර්ෂය තුළ එය අදාල අංශය විසින් භාවිතා කර ඇත.

IV) **<u>GIS project – Rs 1,578,739.00</u>**

ඉහත ව්‍යාපෘති ශේෂය ආයතනයේ Projects අංශයේ පැවති අතර 2015 වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනිම සඳහා භාවිතා කර ඇත.

V) **<u>Nelc Project Rs 2,932,351.00</u>**

ඉහත ව්‍යාපෘති ශේෂය ආයතනයේ Projects ආයතනයේ පැවති අතර 2015 වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනිම සඳහා භාවිතා කර ඇත.

(ආ) <u>අයවිය යුතු ණය ශේෂය</u>

I) <u>එස්.ජේ පතිදරන් - ආපදා ණය රු137,648.00</u>

ඔහුට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඔහුගෙන් අයවිය යුතු මුදල් සඳහා අපදා ණය ශේෂය වන රු 137,648.00 ක මුදල් ඇතුලත් කර ඇත.

II) <u>පී. එස්.එස්.ජේ පියසිරි. සේවක ණය රු 4,930.00</u>

අදාල ණය මුදල අයකර ගැනිමට නොහැකි බව තහවුරු වී ඇති නිසා කළමණාකරන මණ්ඩල අනුමැතිය ඇතිව පොත්වලින් ලියාහැර ඇත.

III) <u>එම්. සී. ජී. ලියනගේ -ආපදා ණය රු 30,560.00</u>

අදාල ණය මුදල ඔහුගේ විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනිම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවට දැනුම් දී ඇත.

IV) <u>එස්. සී. ජී. එම්. ඩී. සිල්වා -ආපදා ණය රු 55,836.00</u>

අදාල ණය මුදල ඔහුගේ විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනිමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවට දැනුම් දි ඇත.

V) <u>**ජී. එස්. ඩී. පීරිස්- උත්සව අත්තිකාරම් රු 2,800.00**</u>

අදාල උත්සව අත්තිකාරම් මුදල අයකරගත නොහැකි බව තහවුරු වි ඇති නිසා කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ඇතිව පොත්වලින් ලියාහැර ඇත.

VI) <u>**එස්.ඒ. එම් ප්‍රියදර්ශනි- උත්සව අත්තිකාරම් රු 2,100.00**</u>

අදාල උත්සව අත්තිකාරම් මුදල අයකරගත නොහැකි බව තහවුරු වී ඇති නිසා කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ඇතිව පොත්වලින් ලියාහැර ඇත.

VII) <u>ටී. එස්. ප්‍රනාන්දු -උත්සව අත්තිකාරම් රු 1,000.00</u>

අදාල උත්සව අත්තිකාරම් මුදල අයකරගත නොහැකි බව තහවුරු වි ඇති නිසා කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ඇතිව පොත්වලින් ලියාහැර ඇත.

(ඇ) අදාල ලැබිය යුතු පාඨමාලා ගාස්තුව අයකර ගැනිමට කටයුතු කර ඇත.

2.5 <u>නීති රිති රෙගුලාසි හා කළමණාකරන නීතිරිති වලට අනුකූල නොවීම</u>

(අ) අත්තිකාරම් ලබාදෙන සෑම අවස්ථාවකම ඒ සඳහා නිසි ඇස්තමේන්තුවක් ඉදිරිපත් කල යුතුය. නමුත් සමහර අවස්ථාවල අත්තිකාරම් ලබාගැනිමේදී සැලසුම්කල කාර්යයන් සියල්ල සම්පූර්ණ කිරිමට නොහැකි වීම නිසා ලබාගත් අත්තිකාරම් මුදලින් යම් ප්‍රමාණයක් ආපසු ගෙවා ඇත. මෙය අවම කර ගැනිමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරමි.

(ආ) අදාල පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල අනුමැතිය ලබාගෙන ඇති අතර අනුමැතිය සඳහා වන ඉල්ලුම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත යොමු කර ඇත.

**3.** <u>**මූල්‍ය සමාලෝචනය**</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිපල</u>

**සටහන් කර ගතිමි**

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>ගිවිසුම් හා බැදුම්කර කඩකිරිම</u>

(අ) ගිවිසුම් හා බැදුම්කර කඩ කළ අයගේ තොරතුරු නිරූපනය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට කටයුතු කරමි.

(ආ) එස්.ජේ පතිරදන් මහතාගෙන් අයවිය යුතු මුදල රු.3,440,575.75 කි. ඔහුට එරෙහිව අධිකරණයේ නඩු පවරා ඇති අතර පදිංචිය හැර ගොස් තිබෙන නිසා ඊට ඉදිරි පියවර ලෙස ඔහුට එරෙහිව නියෝජ්‍ය ලේඛකාධිකාරි විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක සාක්ෂිකරු වන පරිදි කොළඹ වංචා විමර්ශන ඒකකය වෙත කරන ලද පැමිණිල්ල පරිදි එහි අංක 02 ඒකකය විසින් වැඩිදුර විමර්ශනය කරන ලදී. එහිදී අනාවරණය වූයේ ඔහු රටින් පලා ගොස් ඇති බවයි. දැනට මේ සම්බන්ධයෙන් අන්තර්ජාතික රතු වරෙන්තුවක් නිකුත් කරවා ගැනීම කෙරෙහි නීතිපති දෙපාර්තමේන්තුවේ අවධානය යොමුවී ඇති අතර මීට සමගාමීව ඔහුගේ අර්ථ සාධක අරමුදලේ 2014-12-31 දිනට ශේෂය වන රු.1,749,660.37 මුදල අධිකරණයට වාර්තා කොට අයකර ගැනීම පිණිස ඉදිරි පියවර ගැනේ.

4.2 <u>අරමුදල් ඌන උපයෝජනය</u>

අදාල අරමුදල් 2015 වර්ෂය තුල භාවිතාකර ඇත.

4.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) I) <u>**Equipment Replacement Fund Rs.3,252,477.00**</u>

මෙම අරමුදල 2015 වර්ෂය තුල ප්‍රාග්ධන භාණ්ඩ මිලදි ගැනිම සඳහා භාවිතා කර ඇත.

II) <u>**Hardware & software fund Rs 1,591,328.00**</u>

මෙම අරමුදල 2015 වසර තුල ප්‍රාග්ධන ප්‍රාග්ධන මිලදි ගැනිම සඳහා යොදවා ඇත.

(ආ) මෙය අරමුදල් ලැබීම් ඉක්මවා වියදම් කිරිමක් නොව උපයන අරමුදල් ආයතනයේ ප්‍රාග්ධන වියදම් සඳහා යොදවාගැනිමට අදාල අංශවලින් මාරු කිරිමේදි ගිණුම් සටහන්වල වූ වරදකි.එය නිවැරදි කිරිමට කටයුතු කර ඇත.

5 (අ) වත්කම් පාලනය

සටහන් කර ගතිමි.

(ආ) ගිවිසුම් හා බැදුම්කර

සටහන් කර ගතිමි

(ඇ) මූල්‍ය පාලනය

සටහන් කර ගතිමි.

මෙයට විශ්වාසී

මහාචාර්ය ජී එන් වික්‍රමනායක
අධ්‍යක්ෂ

පිටපත්-

1. ලේකම්, මුදල් අමාත්‍යාංශය
2. ලේකම්, විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
3. සභාපති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය